ධීවර අමාත්‍යාංශය
கடற்றொழில் அமைச்சு
Ministry of Fisheries

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report
2021









ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
இலங்கை தேசிய நீரியல் வாழ் செய்கை அபிவிருத்தி அதிகார சபை
National Aquaculture Development Authority of Sri Lanka

වාර්ෂික වාර්තාව

2021

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

41/1, නව පාර්ලිමේන්තු පාර,

පැලවත්ත,

බත්තරමුල්ල.

දුරකථන අංකය: 011 2786495

ෆැක්ස් අංකය: 011 2786493

වෙබ් අඩවිය: www.naqda.gov.lk

පටුන

1	**ආයතනික තොරතුරු**	3
2	**සභාපතිතුමාගේ සමාලෝචනය**	5
3	**තිරසාර සංවර්ධනයට අනුකූල වීම**	19
4	**අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව**	20

ආයතනික තොරතුරු

ආයතනයේ නම

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

දැක්ම

ජලජීවී වගාව සහ මිරිදිය ධීවර කර්මාන්තයෙහි තිරසාර සංවර්ධනය සහ කලමණාකාරීත්වය තුළින් ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය සහ ජීවන තත්ත්වය උසස් කිරීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත් වීම

මෙහෙවර

කුඩා, මධ්‍යම සහ විශාල පරිමාණ ජලජීවී ව්‍යාවසායන් සංවර්ධනය දිරිමත් කිරීම හා චිරස්ථායී ලෙස ජලජ සම්පත් කළමනාකරණය තුලින් මිරිදිය හා කිවුල්දිය මසුන් සුලභ කිරීමට පහසුකම් සැලසීමන් ග්‍රාමීය සම්ජයේ දුප්පත්කම තුරන් කිරීම සහ සමාජ ආර්ථික තත්ත්වයන් දියුණු කිරීමට දායක වීම.

අධ්‍යක්ෂ මණ්ඩලය

1. බී. විජයරත්න මහතා - සභාපති
2. බී. පී. එල්. යූ. බාලසූරිය මහතා - අධ්‍යක්ෂ
3. ගනේෂ්මූර්ති රාජ්කුමාර් මහතා - අධ්‍යක්ෂ
4. ඩී.වී. උපුල් මහතා - අධ්‍යක්ෂ
5. මහාචාර්ය එම්. ජේ.එස්. විජේරත්න මහතා - අධ්‍යක්ෂ
6. එස්. ජේ. කහවත්ත මහතා - අධ්‍යක්ෂ
7. පී. එච්. හඳුන්හේවා මහත්මිය - අධ්‍යක්ෂ
8. ආර්. එච්. එම්. පී. අබේකෝන් මහත්මිය - අධ්‍යක්ෂ
9. ටී.ඒ.ඩී. ධම්මික ප්‍රේමරත්න මහතා - අධ්‍යක්ෂ
10. චන්දිකා ඇතුගල මහත්මිය - අධ්‍යක්ෂ

ප්‍රධාන කාර්යාලය

41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල

විගණක

විගණකාධිපති දෙපාර්තමේන්තුව

බැංකුකරුවෝ

මහජන බැංකුව, බත්තරමුල්ල

ලංකා බැංකුව, පැලවත්ත

සභාපතිතුමාගේ සමාලෝචනය

2021 දෙසැම්බර් 31 දිනට අවසන්වන වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙහි වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

හැඳින්වීම

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය 2021 ජනවාරි මස 01 දින සිට ආරම්භ වූ මාස 12ක කාලසීමාව තුළ පසුගිය වර්ෂවල මෙන්ම කාර්ය සාධනයෙහි දියුණුවක් පෙන්නුම් කරන ලදි.

මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය

වගුව 1 - පසුගිය වර්ෂවල මිරිදිය මත්ස්‍ය හා ජලජීවී වගා නිෂ්පාදනය

වර්ෂය	මිරිදිය ධීවර හා ජලජීවී වගා නිෂ්පාදනය (මෙ.ටොං.)	වෙරළබඩ ජලජීවී වගාව හා ඉස්සන් නිෂ්පාදනය (මෙ.ටොං.)	මුළු නිෂ්පාදනය (මෙ.ටොං.)	පසුගිය වසරට වඩා නිෂ්පාදනයෙහි ඉහළයාම ප්‍රතිශතයක් ලෙස (%)
2014	70,600	5,150	75,750	13
2015	60,210	7,090	67,300	-11.2
2016	67,900	6,030	73,930	10
2017	76,953	5,587	82,540	12
2018	73,910	14,100	88,010	7
2019	77,340	13,240	90,580	3
2020	89,520	12,700	102,220	13
2021	85,560	18,890	104,450	2

මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය

2021 වර්ෂයේ මිරිදිය මත්ස්‍ය හා ජලජීවී නිෂ්පාදනය මෙ.ටොන් 104,450 ක් වූ අතර එම ප්‍රමාණය 2020 වසරට වඩා මෙ.ටොන් 2,230 කි. 2020 ට සාපේක්ෂව කිවුල්දිය ඉස්සන් නිෂ්පාදනය 96% කින් ඉහළ ගොස් ඇති අතර එය වෙරළබඩ ජලජීවී වගා නිෂ්පාදනයේ 49% ක වැඩිවීමක් සහතික කළේය. කොවිඩ් 19 කාලය තුළ ධීවර අංශය අත්‍යවශ්‍ය සේවාවක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එම නිසා එම කාලය පුරාවට ම ජලාශ වල මසුන් ඇල්ලීම සිදු කරන ලදී. පසුගිය වර්ෂවල මිරිදිය මත්ස්‍ය හා ජලජීවී වගා නිෂ්පාදනය වගුව 1 හි දක්වා ඇත.

විදේශ විනිමය ඉපයීම හා ග්‍රාමීය ආර්ථිකය සඳහා දායකත්වය

2021 වසරේ මිරිදිය මත්ස්‍ය හා ජලජීවී නිෂ්පාදන වටිනාකම රු. බිලියන 51 ක් පමණ ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එමඟින් ආර්ථිකයට අතිමහත් දායකත්වයක් කර ඇත. තවද වගා

කරන ලද ඉස්සන් අපනයනය තුලින් රු. මිලියන 8,462 ක විදේශ විනිමයක් උපයා ඇති අතර මෙය 2020 වසරේ රු. මිලියන 3,235 හා සසඳන කල 162% වැඩිවීමකි. විසිතූරු මත්ස්‍ය අපනයනය තුලින් රු. මිලියන 4,193 ක විදේශ විනිමයක් උපයා ඇති අතර මෙය 2020 වසරේ රු. මිලියන 2,409 හා සසඳන කල 74% වැඩිවීමකි. *(මූලාශ්‍ර: www.fisheries.gov.lk සහ නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය)*

මිරිදිය ධීවර හා ජලජීවී වගා අංශයට කොවිඩ් 19 බලපෑම

කොවිඩ් 19 සමයේ ධීවර අංශය අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. එබැවින් මිරිදිය ජලාශවල ධීවර කටයුතු මෙම කාලය පුරාවටම සිදු කරන ලදී. නමුත් ධීවරයින්ට ධිවර කටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටියද ධීවරයින් ධීවර කටයුතු වල නිරත වීම අඩුවීම හේතුවෙන් නිෂ්පාදනයේ අඩුවීමක් දක්නට ලැබුණි. නිරෝධායන ඇදිරි නීතිය හේතුවෙන් විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ සහ අනෙකුත් ජලජීවී වගා කර්මාන්තවල ක්‍රියාකාරකම් තරමක් දුරට අඩාල විය. විශේෂයෙන්ම, ඇදිරි නීතිය හේතුවෙන් කර්මාන්තයට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම සහ පහසුකම් කළමනාකරණය කිරීම සඳහා ජනතාවගේ ගමනාගමනයට බලපෑම් එල්ල විය. කෙසේ වෙතත්, මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සමඟ නිසි ලෙස ක්‍රියාත්මක විය.

මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය හා බෙදා හැරීම

2021 වසරේ දී උඩවලව, දඹුල්ල, ඉහිණියාගල, කලාවැව, ඉරණමඩුව, පොලොන්නරුව, නුවරඑළිය සහ මුරුතවෙල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයන්හි නිෂ්පාදනය කරන ලද මත්ස්‍ය ඇසිත්තන් සංඛ්‍යාව මිලියන 239.76කි. මෙය 2020 වසරට සාපේක්ෂව 29% ක වර්ධනයකි. මෙම ඇසිත්තන්ගෙන් වැඩි ප්‍රමාණයක් මත්ස්‍ය ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීම සඳහා පෞද්ගලික පොකුණු, කූඩු, කොටු සහ ප්‍රජා පාදක සංවිධාන විසින් කළමනාකරණය කරන මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක සඳහා නිකුත් කර ඇත. 2016 සිට 2021 දක්වා මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය සහ බෙදා හැරීම වගුව 2 හි දක්වා ඇත.

වගුව *2* - ඇසිත්තන් නිෂ්පාදනය සහ බෙදා හැරීම (මිලියන)

නිෂ්පාදන ඒකක	2016	2017	2018	2019	2020	2021
ප්‍රජා මූලික මත්ස්‍ය නිෂ්පාදන ඒකක සඳහා	15.76	19.13	26.35	20.43	14.60	31.05
ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානවල ඇඟිල්ලන් නිෂ්පාදනය සඳහා	57.64	60.82	79.02	57.85	100.03	113.11
පෞද්ගලික පොකුණු හිමියන් සඳහා	8.53	6.63	16.89	23.73	23.40	36.59
කූඩු / කොටු සඳහා	30.34	47.20	60.26	42.31	47.60	59.01
එකතුව	**112.27**	**133.78**	**182.52**	**144.32**	**185.63**	**239.76**

මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය

මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය

2021 වර්ෂය තුළ ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන, ප්‍රජා මූලික මත්ස්‍ය නිෂ්පාදන ඒකක, කූඩු, කොටු හා පෞද්ගලික පොකුණු වල මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 111.58 ක් නිපදවන ලදි. 2020 ට සාපේක්ෂව ඇඟිලි නිෂ්පාදනය 16% කින් වැඩි විය. ඉහත සඳහන් මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනයෙන් 38%ක් ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන මගින් ද ඉතිරිය ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන මගින් නිකුත් කල ඇසිත්තන් පෞද්ගලික පොකුණු, කූඩු, කොටු සහ ප්‍රජා පාදක සංවිධාන විසින් කළමනාකරණය කරන මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක තුල වර්ධනය කිරීමෙන් ලබා ගෙන ඇත. 2016 - 2021 කාලපරිච්ඡේදය තුළ විවිධ නිෂ්පාදන ඒකකවල සම්පූර්ණ මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය වගුව 3 හි පෙන්වා ඇත.

වගුව **3** - මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය (මිලියන)

නිෂ්පාදන ඒකක	2016	2017	2018	2019	2020	2021
ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය නිෂ්පාදන ඒකක	10.30	13.38	16.74	15.03	12.07	17.23
ජලාශ්‍රිත මූලික කුඩා පරිමාණ මත්ස්‍ය නිෂ්පාදන ඒකක	-	-	0.46	0.04	0.42	0.22
ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වල ඇඟිල්ලන් නිෂ්පාදනය	37.29	38.07	48.20	29.17	36.40	42.14
පෞද්ගලික පොකුණු හිමියන්	4.07	3.31	7.44	14.26	15.14	26.75
කූඩු / කොටු	18.11	28.16	38.79	30.09	31.91	25.24
එකතුව	**69.77**	**82.92**	**111.63**	**88.59**	**95.94**	**111.58**

මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය

මත්ස්‍ය ඇඟිල්ලන් බෙදා හැරීම

ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන, පෞද්ගලික පොකුණු, ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක, කොටු සහ කූඩු මඟින් 2021 වසරෙහි නිෂ්පාදනය කරන ලද මත්ස්‍ය ඇඟිල්ලන් ජලාශවල තැන්පත් කිරීම පිළිබඳ විස්තර වගුව 4හි දක්වා ඇත. 2021 වසර තුල වැඩි මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රමාණයක් තැන්පත් කිරීම තුලින් 2022 වසරේ මිරිදිය ධීවර හා ජලජීවී වගා මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීමට ඉවහල් වේ.

වගුව 4 - මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම - 2021

ජලාශ වර්ගය	ජලාශ සංඛ්‍යාව	මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම (මිලියන)
විශාල පරිමාණ ජලාශ	41	28.62
මධ්‍යම පරිමාණ ජලාශ	80	29.91
කුඩා පරිමාණ ජලාශ	320	34.29
කාලීන ජලාශ	735	13.23
පොකුණු	259	2.37
ගංහා සහ කළපු	-	2.43
එකතුව	**1435**	**110.85**

මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය

දැනට පවතින ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වල අභිජනන පහසුකම්, මත්ස්‍ය බීජ වර්ධක පහසුකම් සහ යටිතල පහසුකම් පුළුල් කිරීම, මිරිදිය මත්ස්‍ය බීජ නිෂ්පාදනය ඉහළ නැංවීමට ඉවහල් වේ. මේවන විට බොහොමයක් කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක, ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන මඟින් ලබා ගන්නා මත්ස්‍ය ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීම සිදුකරනු ලබයි. ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සතු ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වලින් පමණක් මත්ස්‍ය බීජ සඳහා ඇති ඉල්ලුම සපුරාලීම දුෂ්කර බැවින් තෝරාගත් කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක 10ක් මත්ස්‍ය පසුකිටයන් අවධියේ සිට ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීම සඳහා වැඩිදියුණු කිරීමට කටයුතු කර ඇත. ඒකක 10 ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇති අතර ඒකක 06 ක වැඩිදියුණු කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර ඒකක 04 ක වැඩිදියුණු කිරීමේ කටයුතු 90% අවසන් කර ඇත.

ජලාශ වල තැන්පත් කිරීමට අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් සැපයුම ඉහල නැංවීම සඳහා මත්ස්‍ය අභිජනන තාක්ෂණය ධිවර ප්‍රජාවට හඳුන්වා දීමට සැලසුම් කර ඇත. මෙමඟින් වාර්ෂිකව අවහ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් තිරසර ලෙස සැපයීමට හැකියාව ලැබේ. සුදුසු ස්ථාන 03ක් (එක්ගල් ඔය, අම්පාර / පරෙයිපඤ්ඤං, ත්‍රිකුණාමලය / පුතුමුරිප්පු, කිලිනොච්චි) තෝරා ගෙන ඇති ඉදිකිරීම් කටයුතු සිදුකෙරේ.

<u>දඹුල්ල මත්ස්‍ය ජාන සංවර්ධන ඒකකය පිහිටුවීම</u>

දඹුල්ල මත්ස්‍ය ජාන සංවර්ධන ඒකකයේ ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතින අතර වැඩි ගුණාත්මක තත්ත්වයකින් යුතු මව් මසුන් නිෂ්පාදනය, මත්ස්‍ය බීජ වල ගුණාත්මකභාවය වැඩිකිරීම, මිරිදිය ජලජීවී වගාව සඳහා ලුලා (*Ophiocephalus striatus*), වලයා (*Walago attu*) වැනි දේශීය විශේෂ වල නව මත්ස්‍ය ප්‍රභේද නිපදවීම මූලික අරමුණු වේ. මෙම නව මත්ස්‍ය ප්‍රභේද හඳුන්වා දීමෙන් මිරිදිය ජලජීවී වගාව වඩාත් විවිධාංගීකරණය වනු ඇත. එබැවින් ශ්‍රී ලංකාවේ තිරසාර මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සහතික කිරීම සඳහා මත්ස්‍ය ජාන සංවර්ධන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම වැදගත් වේ.

දේශීය ආහාරය සඳහා සුදුසු මසුන් සහ විසිතුරු මත්ස්‍ය මව් සතුන් එකතු කර අභිජනන පරීක්ෂණ පහත පරිදි සාර්ථකව සිදු කරන ලදී.

- *Labeo lankae* (වඳවීමේ තර්ජනයට ලක්ව ඇති) (තඹලයා/ Red fin labeo) අභිජනනය.
- *Systomus sarana* (Olive barb/ මස් පෙතියා) වර්ධනය කර අභිජනනය.
- *Channa ara* (Giant snakehead/ ගං ආරා) මව් මසුන් එකතු කරන ලදි.
- *Anabas testudineus* (Claimbing perch/ කාවයියා) අභිජනනය.
- *Channa striata* (Striped snakehead /**ලූලා**) අභිජනනය.
- *Heteropneustes fossilis* (Stinging catfish/ හුංගා) අභිජනනය.
- *Ompok cylonensis* (Butter catfish/ වලපොත්තා) අභිජනනය.
- *Garra ceylonesis* (NT) (Stone saucer / ගල්පාදි) අභිජනනය.
- දේශීය ආහාර සඳහා වන මත්ස්‍ය විශේෂ සඳහා වර්ධන පරීක්ෂණයක් සිදුකරන ලදී.

මිරිදිය ඉස්සන් පසු කීටයන් නිෂ්පාදනය

පම්බල හා කහඳමෝදර පිහිටි අභිජනනාගාර සහ පෞද්ගලික අභිජනනාගාරය මඟින් 2021 වසර තුළ මිරිදිය ඉස්සන් පසු කීටයන් මිලියන 52.16ක් නිපදවන ලද අතර අදාල වර්ෂය තුල දී තැන්පත් කිරීම් පහත දක්වා ඇත. කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් බෝ කිරීම සඳහා ජලාශවලින් පැටවුන් එකතු කිරීමේ දුෂ්කරතාවන්ට මුහුණ පෑම හේතුවෙන් විශේෂයෙන් මිරිදිය ඉස්සන් අභිජනනාගාරවල අභිජනන කටයුතු අඩාල වූ අතර, මිරිදිය ඉස්සන් පසු කීටයන් නිෂ්පාදනය 2020 වසරට සාපේක්ෂව 33% කින් අඩුවී ඇත. 2021 වසරේ ජලාශ වර්ගය අනුව මිරිදිය ඉස්සන් පසු කීටයන් තැන්පත් කිරීම් වගුව 5හි දක්වා ඇත.

වගුව 5 - මිරිදිය ඉස්සන් පසු කීටයන් තැන්පත් කිරීම - 2021

ජලාශ වර්ගය	ජලාශ සංඛ්‍යාව	තැන්පත් කරන ලද පසු කීටයන් (මිලියන)
විශාල පරිමාණ ජලාශ	33	15.40
මධ්‍යම පරිමාණ ජලාශ	59	17.13
කුඩා පරිමාණ ජලාශ	142	17.16
කාලීන ජලාශ	4	0.21
පොකුණු	7	0.08
කළපු	9	2.18
එකතුව	**254**	**52.16**

මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය

මේ වනවිට ආයතන හතරක් මිරිදිය ඉස්සන් අපනයනය කරන අතර 2021 වසර තුළ මෙ. ටොන් 1040 ක අස්වැන්නක් ලබා ගෙන ඇති අතර මෙ. ටොන් 123 ක් අපනයනය කර ඇත. මිරිදිය ඉස්සන් වැඩි වටිනාකමක් ඇති විශේෂයක් බැවින් ධීවරයන්ගේ ආදායම් ඉහළ යයි. මිරිදිය ඉස්සන් ජලාශවල තැන්පත් කිරීම සඳහා ආයෝජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ, මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීමට වඩා සාපේක්ෂව වැඩිවේ.

නොමිලයේ මත්ස්‍ය / ඉස්සන් පැටවුන් නිකුත් කිරීමේ වැඩසටහන

මෙම වැඩසටහන යටතේ මත්ස්‍ය ඇසිත්තන් මිලියන 45.66, මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 61.52, මිරිදිය ඉස්සන් පසු කීටයන් මිලියන 28.42 සහ කිවුල්දිය ඉස්සන් පසු කීටයන් මිලියන 49ක් 2021 වසර තුළ ජලාශවල නොමිලේ තැන්පත් කර ඇත.

ජලාශවල ධීවර කළමනාකරණ කටයුතු

නීත්‍යානුකූල නොවන ධීවර ආම්පන්න භාවිතය වලක්වා නිත්‍ය ජලාශවල මිරිදිය ධීවර කටයුතු නියාමනය සහ කළමනාකරණය කිරීම සඳහා අධිකාරිය විසින් සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම සමඟ එක්ව වැටලීම් ඒකකයක් ස්ථාපනය කරන ලද අතර මීට අමතරව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, දැනට පවතින ග්‍රාමීය ධීවර සංවිධාන ශක්තිමත් කිරීම ද සිදුකර ඇත. තව ද මිරිදිය ධීවර කර්මාන්තය සඳහා දැල් කූඩු 312 ක් ලබා දී ඇත. මේ වන විට ක්‍රියාත්මක මිරිදිය ධීවර යාත්‍රා සංඛ්‍යාව 9,940 කි.

ඉස්සන් වගා කර්මාන්තය

ඉස්සන් වගාව ශ්‍රී ලංකාවේ වඩාත්ම ලාභදායී වාණිජ ජලජීවී වගාව වන අතර අධිකාරියෙහි අඛණ්ඩ නිරීක්ෂණ සහ අධීක්ෂණ කටයුතු හේතුවෙන් අද ඉස්සන් කර්මාන්තය ඵලදායී මට්ටමකට පැමිණ ඇත. ඉස්සන් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ජල ප්‍රතිචක්‍රීකරණ ක්‍රමයක් හඳුන්වාදීම සහ වගා කරන ප්‍රදේශවල ජෛව සුරක්ෂිතතාව ඉහළ නැංවීම තුළින් ඉස්සන් වගා ක්‍රියාකාරකම් තීව්‍ර කිරීම, ලන්දේසි ඇල හැරීම, පුත්තලම දිස්ත්‍රික්කයේ ඉස්සන් ගොවිපළ සඳහා පොදු විදුලිය සැපයීම අධිකාරිය සැලසුම් කර ඇත. මෙමඟින් ප්‍රදේශයේ ඉස්සන් නිෂ්පාදනය වැඩි කිරීමට හැකිවනු ඇත. 2021 වසරේ වැඩිම ඉස්සන් නිෂ්පාදනය වන මෙට්‍රික් ටොන් 14,415ක් ලබා ගත් අතර මෙය 2020 වසරට සාපේක්ෂව 143%ක වැඩිවීමකි. ඉස්සන් අපනයනයෙන් ඉපැයූ විදේශ විනිමය රු. මිලියන 8,462 කි.

ජලජීවී වගා කළමනාකරණ බලපත්‍ර 342 ක් නිකුත් කරන ලද අතර මින් 310 ක් ඉස්සන් ගොවිපල සඳහා ද 32 ක් ඉස්සන් අභිජනනාගාර සඳහා ද නිකුත් කරන ලදි. අධිකාරිය 2021 වසර තුල ඉස්සන් පසු කීටයන් සහ මව් මත්ස්‍යයින්ගේ රෝග සඳහා PCR පරීකෂණ 3096 ක් සිදුකර ඇති අතර මෙම පරීකෂණ බත්තුළුඔය ස්ථාපිත මත්ස්‍ය රෝග නිර්ණය සහ සෞඛය කළමනාකරණ විද්‍යාගාරය මගින් සිදුකරනු ලැබේ. මෙම පරීකෂණ, ගොවිපල වල තැන්පත් කිරීම සඳහා නිරෝගී පසු කීටයන් අභිජනනය සඳහා ඉවහල් වේ. තව ද පසු කීටයන්ගේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා, සියලුම ඉස්සන් අභිජනනාගාර Monodon Bacula වෛරස් හා සුදු පුල්ලි රෝග සඳහා පරීක්ෂා කිරීමෙන් අමිහිරි ජල මත්ස්‍ය සෞඛ්‍ය හා පාරිසරික රසායනාගාරයේ නිලධාරීන් විසින් නිරීක්ෂණය කරන ලදී.

2021 වසරෙහි දී පුත්තලම, මඩකලපුව, මන්නාරම දිස්ත්‍රික්කයන්හි ඉස්සන් අභිජනනාගාර 49 ක් සහ ඉස්සන් ගොවිපල 898 ක් ක්‍රියාත්මක විය. අදාල වර්ෂය තුළ *Peneaus monodon* පසු කීටයන් නිෂ්පාදනය මිලියන 192ක් හා *Litopeneaus vannamei* පසු කීටයන් නිෂ්පාදනය මිලියන 544.2 කි.

විසිතුරු මසුන් සහ ජලජ පැලෑටි වගාව

නැක්ඩා ආයතනය විසින් මසුන්ගේ නව ප්‍රභේද බිහිකිරීම, තාකෂණ සංවර්ධනය, මව් මසුන් සැපයීම, මත්ස්‍ය රෝග නිර්ණයන,පුහුණුව සහ තාකෂණ උපදෙස් සැපයීම යනාදීය මඟින් විසිතුරු මසුන් හා ජලජ පැලෑටි වගාව මෙන්ම අපනයන සඳහා සහාය වෙනු ලබයි. රම්බඩගල්ල, ගිණිගත්හේන සහ සෙවනපිටිය ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන විසිතුරු මසුන් සහ ජලජ පැලෑටි වගාව සංවර්ධනයට අදාල කාර්යයන් සඳහා වෙන්කර ඇත. ජානමය විවිධත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා රම්බඩගල්ල මධ්‍යස්ථානයේ ගප්පි ප්‍රභේද සහ ගිණිගත්හේන මධ්‍යස්ථානයේ ස්වෝඩ් ටේල් ප්‍රභේද වල ජාන ප්‍රවර්ධන වැඩසටහන් ආරම්භ කර ඇත. විසිතුරු ජලජ පැලෑටි පටක රෝපණය සඳහා රම්බඩගල්ල මධ්‍යස්ථානයේ පටක රෝපණ විද්‍යාගාරයක් පිහිටුවා ඇත. මෙහි මූලික අරමුණ වනුයේ තාක්ෂණික සහ ජලජ පැලෑටි අපනයනය තුලින් විදේශ විනිමය ඉපයීමය. 2021 වසරේ නිෂ්පාදිත ජලජ පැළෑටි සංඛ්‍යාව 46,232ක් විය.

මෙම මධ්‍යස්ථාන මඟින් විසිතුරු මසුන් මිලියන 6.45 ක් ගොවීන්ට හා අපනයන කරුවන්ට අළෙවිකර ඇත. මව් මසුන් 35,070 ක්ද මෙම වර්ෂය තුළ සපයා ඇත. මිරිදිය විසිතුරු මසුන් වඩාත් වර්ණවත් හා කැපී පෙනෙන ගප්පි, ස්වෝඩ්ටේල්, ප්ලේටි, බාර්බස්, ටෙට්‍රා, ඒන්ජල්, ගුරමි සහ කැටිෆිෂ් විශේෂ වලින් සමන්විත වේ. ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද මෙම මිරිදිය විශේෂ අතුරින් 50-60% පමණ ගප්පි වලින් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ නිත්‍ය අපනයන සමාගම් 45 ක් පමණ ඇත. 2021 දී ශ්‍රී ලංකාවේ විසිතුරු මසුන් සඳහා ප්‍රධාන ගැනුම්කරුවන් වූයේ ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ජර්මනිය, චීනය, ඕස්ට්‍රේලියාව, පෝලන්තය, ප්‍රංශය, ජපානය,එක්සත් ආරාබි එමීර් රාජ්‍යය ඉතාලියයි. අදාල වර්ෂය තුළ විසිතුරු මසුන් වගා ක්ෂේත්‍රයේ 1112 දෙනෙකු පුහුණු කර ඇත. කොවිඩ් 19 හේතුවෙන් සැලසුම් කළ පරිදි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක නොවීය.

කරදිය විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය, පුත්තලම, බංගදෙනිය

මේවන විට ශ්‍රී ලංකාව කරදිය විසිතුරු මසුන් අපනයනය කරනුයේ මුහුදෙන් අල්ලාගෙන පම,. මසුන් වැඩිපුර ඇල්ලීම, මසුන්ගේ වාසස්ථාන විනාශ වීම, කොරල් විනාශ වීම, මුහුදු පත්ලේ රොන්මඩ තැන්පත් වීම, දූෂණය ආදී නොයෙකුත් පාරිසරික හේතූන් මත කරදිය විසිතුරු මත්ස්‍ය ගහණය අඩුවෙමින් පවතින අතර එම මසුන් සංරක්ෂණය සඳහා ඉදිරියේදී කරදිය විසිතුරු මසුන් ඇල්ලීම සීමා කිරීමට කටයුතු කරනු ඇත. මෙය ශ්‍රී ලංකාවේ කරදිය විසිතුරු මසුන් අපනයනයට බලපානු ඇත. එම නිසා කෘතිමව අභිජනනය කර අපනයනය කිරීමට ඉදිරියේ දී සිදුවනු ඇත. මිරිදිය විසිතුරු මසුන් සමඟ සසඳන කල කරදිය විසිතුරු මසුන් සඳහා ඉතා ඉහළ මිලක් පවතින අතර විදේශ වෙළෙඳපොළ තුළ ඉහළ ඉල්ලුමක් ද පවතී.

විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන පරාසය වැඩිකිරීම, කරදිය විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකිරීම තුලින් අපනයන ආදායම වැඩිකිරීම, තාක්ෂණික දැනුම ලබා දීමේ අරමුණු ඇතිව පුත්තලම බංගදෙනියෙහි කරදිය විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය ඉදිකිරීම් කටයුතු සිදුකෙරෙමින් පවතී.

සාම්ප්‍රදායික නොවන ජලජීවී වගාවන්

- **මුහුදු කූඩැල්ලන් අභිජනනය හා වගාව**

මුහුදු කූඩැල්ලන් අභිජනනාගාරය

මුහුදු කූඩැල්ලන් වගාව ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා මන්නාරම ඔලෙයිතුඩුවායි ප්‍රදේශයේ මුහුදු කූඩැල්ලන් අභිජනන මධ්‍යස්ථානය 2021 මාර්තු 30 වන දින එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී. එසේම යාපනයේ එක් පෞද්ගලික අභිජනනාගාරයක් ක්‍රියාත්මක වන අතර 2021 වසරේ දී පැටවුන් 216,000ක් නිෂ්පාදනය කර ඇත. පෞද්ගලික අංශය විසින් මන්නාරම, කිළිනොච්චිය, හා යාපනය යන දිස්ත්‍රික්ක වල මුහුදු කූඩැල්ලන් වගාව ක්‍රියාත්මක අතර 2021 වසරේ දී මුහුදු කූඩැල්ලන් මෙ.ටොන් 580 ක (තෙත් බර) අස්වැන්නක් ලබා ගෙන ඇත. මුහුදු කූඩැල්ලන් අපනයනය ඉහළ නැංවීම සඳහා කිලිනොච්චියේ වලෙයිපාඩු ප්‍රදේශයේදී මුහුදු කූඩැල්ලන් ගම්මානය ආරම්භ කරන ලද අතර යාපනය දිස්ත්‍රික්කයේ මුහුදු කූඩැල්ලන් වගාව සඳහා අක්කර 1900ක් හඳුනාගෙන ඇත.

- **මුහුදු පැළෑටි වගාව**

උතුරු හා වයඹ පළාත් මුහුදේ මුහුදු පැළෑටි වගාව ප්‍රජා සහභාගීත්වයෙන් සිදුකරන අතර 2021 වසරේ මුහුදු පැළෑටි නිෂ්පාදනය මෙ. ටොන් 218 (තෙත් බර) කි. මුළු වගා වපසරිය හෙක්. 100ක් පමණි.

- **මොදා මත්ස්‍ය අභිජනනය සහ වගාව**

මඩකළපුව, බහු විශේෂ මුහුදු වරල් මත්ස්‍ය අභිජනනාගාරයේ අභිජනන කටයුතු අඛණ්ඩව සිදු කර ඇති අතර 2021 වසරේ දී මොදා මත්ස්‍ය ඇඟිල්ලන් 64,900 නිෂ්පාදනය කර ඇත. මෙය ශ්‍රී ලංකාව තුල මොදා මත්ස්‍ය වගාව ව්‍යාප්ත කිරීම සඳහා මග පාදනු ඇත.

මීගමුව කළපුව, මන්නාරම, පුත්තලම, කිලිනොච්චි, මඩකළපුව හා යාපනය යන දිස්ත්‍රික්කවල මොදා මත්ස්‍ය වගාව සඳහා පුද්ගලික අංශය යොමු වී ඇත. මේ වනවිට වගාකරුවන් 350 දෙනෙකු පමණ පොකුණු හා කූඩු තුල මොදා මසුන් වගාවේ නියැලී සිටී. 2021 වර්ෂයේ මොදා පැටවුන් මිලියන 1.16 තැන්පත් කර ඇති අතර මෙ.ටොන් 466 ක මොදා අස්වැන්නක් ලබා ගෙන ඇත.

මහා පරිමාණ කූඩු තුල මොදා මත්ස්‍ය වගා ව්‍යාපෘතියක් පෞද්ගලික සමාගමක් විසින් ත්‍රිකුණාමල මුහුදේ ආරම්භ කරන ලදි. වානිජ මට්ටමින් මුහුදු ආශ්‍රිත මත්ස්‍ය වගාව රටට හඳුන්වා දීම මෙමගින් සිදුවේ. තවද මෙම ව්‍යාපෘතිය මගින් සෘජු රැකියා ඇති කිරීම තුලින් වෙරළබඩ ජනතාවගේ ජීවනෝපාය ඇති කිරීම, ස්වාභාවික මත්ස්‍ය ගහණය වෙත වන බලපෑම අවම වීම, නොකඩවා මත්ස්‍ය නිෂ්පාදනය අපනයන වෙළඳපලට සැපයීම මගින් විදේශ විනිමය වැඩි කිරීම, සංචාරකයින්ගේ ආකර්ෂණය ලබා ගැනීම බලාපොරොත්තු වේ. 2021 වර්ෂයේ මෙ.ටොන් 406 ක මොදා අස්වැන්නක් ලබා ගෙන ඇත.

- **වෙක්කයා මත්ස්‍ය අභිජනනය හා වගාව**

වෙක්කයා මත්ස්‍යයින් ටූනා මත්ස්‍යයින් සඳහා අවශ්‍ය මත්ස්‍ය ඇම වශයෙන් මෙන්ම ආහාරය සඳහා ද වගා කල හැකි මත්ස්‍ය විශේෂයක් වන අතර ලෝකයේ වඩාත් වැදගත් මත්ස්‍ය ආහාරයකි. ශ්‍රී ලංකාවේ වෙක්කයා මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය සඳහා අභිජනනාගාරයක් නොමැති අතර, එබැවින් වෙක්කයා මත්ස්‍ය අභිජනනාගාරයක් ස්ථාපිත කිරීම ඉතා වැදගත් ය. මෙමඟින් වෙක්කයා මත්ස්‍ය පැටවුන් ඇම සඳහා වගා කිරීමට හා ආහාර පිණිය වගා කිරීම සඳහා වගාකරුවන් වෙත ලබා දීමට හැකිවනු ඇත. පුත්තලම දිස්ත්‍රික්කයේ බංගදෙනිය

ප්‍රදේශයේ වේක්කයා මත්ස්‍ය අභිජනනාගාරයක් ස්ථාපිත කිරීමට සඳහා අප අධිකාරිය පියවර ගෙන තිබෙන අතර ඉදිකිරීම් කටයුතු සිදුකෙරෙමින් පවතී.

ඇම සඳහා වේකකයා මත්ස්‍ය වගාව යාපනය, කිලිනොච්චිය, මන්නාරම සහ පුත්තලම දිස්ත්‍රික්කවල සිදු කරන අතර 2021 දී මෙට්‍රික් ටොන් 5.1 ක් අස්වැන්නක් ලබා ගන්නා ලදී.

- **කකුළු අභිජනනය හා වගාව**

2021 වර්ෂයේ කකුළු පැටවුන් 50,900 ක් පෞද්ගලික අභිජනනාගාරයක (ඉන්ඩිගෝ ඇක්වා හැචරි) නිෂ්පාදනය කර ඇති අතර පොකුණු වලින් මෙ.ටොන් 6.4 ක කකුළු අස්වැන්නක් ලබා ගෙන ඇත.

රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ වෙරළබඩ ජලජීවී වගා සංවර්ධනය

රැකව ජලජීවී වගා ගොවිපල, හම්බන්තොට

වෙරළබඩ ජලජීවී වගාව සඳහා විශාල විභවයක් දකුණු පළාත තුල පැවතිය ද එම පළාතේ ව්‍යවසායකයින් වෙරළබඩ ජලජීවී වගාව කෙරෙහි අවධානයක් නොදැක්විය. එබැවින් කකුළු වගා ව්‍යාපෘතියක් ආදාර්ශ වගා ව්‍යාපෘතියක් ලෙස දකුණු පළාතේ ආයෝජකයින් ජලජීවී වගාවට යොමු කිරීමේ මූලික අරමුණින් ආරම්භ කරන ලදි. සඳහා සක්‍යතා අධ්‍යනයක් සහ මූලික පාරිසරික ඇගයීමක් සිදුකර මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබා ගෙන ඇත. සක්‍යතා අධ්‍යනය සිදුකරන අවස්ථාවේ රැකව කළපුවේ ලවණතාවය 15 ppt – 25 ppt අතර විය. නමුත්, ශ්‍රී ලංකාවේ දේශගුණික තත්ත්වය වෙනස් වීම මත 2018 – 2019 වර්ෂ වල කළපුවේ ලවණතාවය 10 ppt ට වඩා අඩු වී ඇත. ලවණතාවය අඩු මට්ටමක පැවතීම හේතු කොට ගෙන මඩ කකුළුවන් වගා කිරීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇත. එබැවින් අඩු ලවණතාවයකින් ක්‍රියාත්මක කළ හැකි සහ ඉහළ විදේශ විනිමය උපයා ගත හැකි වාණිජමය වශයෙන් වැදගත් වන පරිසර හිතකාමී කිවුල්දිය ඉස්සන් වගාව ආරම්භ කිරීමට තීරණය විය.

මෙම ඉස්සන් වගා ව්‍යාපෘතිය රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ ක්‍රියාත්මක කිරීමට තීරණය වූ අතර ගොවිපළ ක්‍රියාත්මක කිරීමට සහ කළමනාකරණය කිරීමට උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් පුවත්පත් දැන්වීම් මගින් අභිලාශ කැඳවන ලදි. ඒ අනුව රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් අනතුරුව වසර **30**ක කාලයකට Taprobane Frozen Food (Pvt) Ltd වෙත බදු දී ඇත. මෙමඟින් අදියර **I** යටතේ අපේක්ෂිත ඉස්සන් නිෂ්පාදනය

මෙ.ටොන් 198ක් සහ අදියර **II** යටතේ අපේක්ෂිත ඉස්සන් නිෂ්පාදනය මෙ.ටොන් 550ක් වනු ඇත. එ අනුව පළමු වසර තුළ රු. මිලියන 178.32 ක ආදායමක් ද දෙවන වසරේ සිට රු. මිලියන 499.95 ක ආදායමක් ද බලාපොරොත්තු වේ. මෙම ඉස්සන් වගාව ගොවිපළ ක්‍රියාත්මක කිරීම තුළින් සෘජු රැකියා 48ක් සහ වක්‍ර රැකියා 90ක් පමණ බිහි වේ.

මඩකලපුව දිස්ත්‍රික්කයේ පුදුකුඩිරිප්පු කිවුල්දිය ඉස්සන් අභිජනනගාරය ක්‍රියාත්මක කිරීම හා කළමනාකරණය කිරීම

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට අයත් නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ පුදුකුඩිරිප්පුහි පිහිටි ඉස්සන් අභිජනනාගාරය 2010 වර්ෂයේදී ඉදිකිරීම් නිම කරන ලද්දක් වන අතර,2011 වර්ෂයේ සිට රාජ්‍ය - පෞද්ගලික හවුල් ව්‍යවසායකත්වය යටතේ බදු පදනම මත පවත්වාගෙන ආ මධ්‍යස්ථානයකි. 2011 වර්ෂයේදී මෙම මධ්‍යස්ථානය රාජ්‍ය - පෞද්ගලික හවුල් ව්‍යවසායකත්වය යටතේ King Aqua Services (Pvt) Ltd ආයතනය ක්‍රියාත්මක කල අතර බදු කාල සීමාව අවසන් වීම හේතුවෙන් අභිජනනාගාරය ක්‍රියාත්මක කිරීමට සහ කළමනාකරණය කිරීමට උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් පුවත්පත් දැන්වීම් මගින් අභිලාශ කැඳවන ලදි. ඒ අනුව රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් අනතුරුව වසර 05ක කාලයකට Taprobane Frozen Food (Pvt) Ltd වෙත බදු දී ඇත. මෙමඟින් වසරකට SPF *L. Vannamei* කිවුල්දිය ඉස්සන් පසුකීටයන් මිලියන 97.2 ක් හා SPF *P. monodon* කිවුල්දිය ඉස්සන් පසුකීටයන් මිලියන 97.2 ක් නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වේ.

වෙරළබඩ ජලජීවී වගාව දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක අනෙකුත් සංවර්ධන කටයුතු

කිවුල්දිය ජලජීවී වගා කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අභිලාශ ප්‍රකාශ කැඳවීම (EOI)

- යාපනය හා කිළිනොච්චි දිස්ත්‍රික්ක වල මුහුදු කූඩැල්ලන් අපනයන ගම්මානයේ පොකුරු ක්‍රමයට මුහුදු කූඩැල්ලන් ගොවිපලවල් ක්‍රියාත්මක කිරීම

- හම්බන්තොට, ගල්මුල්ලහි හා මඩකළපුව, කොක්කඩිචෝලේ හි ජලජීවී වගාව සඳහා වෙන් කර ඇති ප්‍රදේශයේ ජලජීවී වගාව

- මඩකලපුව දිස්ත්‍රික්කයේ ධර්මපුරම් හි පිහිටි බහුවිශේෂ මුහුදු වරල් මත්ස්‍ය අභිජනනාගාරය ක්‍රියාත්මක කිරිම හා කළමනාකරණය කිරීම

සමෘද්ධි අමාත්‍යාංශය සමඟ ක්‍රියාත්මක ජීවනෝපාය සංවර්ධන වැඩසටහන

සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ අප අධිකාරිය විසින් ව්‍යාපෘති 2275ක් ආරම්භ කර ඇත. මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 2275ක් සඳහා ව්‍යාපෘති ආරම්භ කිරීම සදහා රු.මි. 269.88ක් ලබා දී ඇත.

අනු අංකය	ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති	ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව
01	කුඩා පරිමාණ විසිතුරු මත්ස්‍ය වගාව	1326
02	විසිතුරු මත්ස්‍ය වගාව වැඩිදියුණු කිරිම	577
03	පොකුණු තුළ මසුන් වගාව	129
04	මුහුදු පැලැටි වගාව	72
05	ජලාශවල දැල් කූඩු තුළ මසුන් වගා ගොවිපල ඇති කිරිම	9
06	කුඩා පරිමාණ මත්ස්‍ය ආහාර නිෂ්පාදන ඒකක පිහිටුවීම	9
07	මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක වැඩි දියුණු කිරීම	15
08	කූඩු තුල මෝදා මසුන් වගාව	89
09	විසිතුරු මත්ස්‍ය අලෙවිසැල් වැඩිදියුණු කිරිම	32
10	ලුණු/ දුම් කරවල නිෂ්පාදනය	17
එකතුව		**2275**

තිරසාර සංවර්ධනයට අනුකූල වීම

මිරිදිය ධීවර හා ජලජීවී වගා අංශය එහි සංවර්ධනය තුළින් තිරසර සංවර්ධන අරමුණු 1 දුරිද්‍රතාවයෙන් තොර වීම, තිරසර සංවර්ධන අරමුණු 2 කුසගින්න තුරන් කිරීම, තිරසර සංවර්ධන අරමුණු 12 - වගකීමෙන් යුතු පරිභෝජනය සහ නිෂ්පාදනය, තිරසර සංවර්ධන අරමුණු 14 - ජලජ තුල ජීවය ඇතුළුව තිරසර සංවර්ධන අරමුණු කිහිපයක් සාක්ෂාත් කර ගැනීමට දායක විය හැකි අතර ඒවා ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය හා කළමනාකරණය සඳහා වගකිව යුතු අමාත්‍යාංශයේ සහ ආයතනවල කාර්යභාරය යටතේ සෘජුවම සම්බන්ධ වේ.

- තිරසර සංවර්ධන අරමුණු 1- දුරිද්‍රතාවයෙන් තොර වීම - අධිකාරිය විසින් ජීවනෝපාය සංවර්ධන කටයුතු අඛණ්ඩව සිදු කර ඇති අතර 2021 දී මිරිදිය ධීවර හා ජලජීවී වගා අංශයේ නියැලී සිටින ධීවරයින් සහ වගාකරුවන් සංඛ්‍යාව 91,020 දක්වා ඉහළ ගොස් ඇත.

- තිරසර සංවර්ධන අරමුණු 2- කුසගින්න තුරන් කිරීම - අපගේ ඉලක්කය වන්නේ කුසගින්න තුරන් කිරීම, ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණය වැඩි දියුණු කිරීම සහ තිරසාර ජලජීවී වගාව ප්‍රවර්ධනය කිරීම වන අතර මේ සඳහා මිරිදිය මත්ස්‍ය හා ජලජීවී නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා වගා පාදක මිරිදිය ධීවර හා ජලජීවී වගාව සංවර්ධනය කිරීම සඳහා අධිකාරිය විසින් වැඩසටහන් ආරම්භ කර ඇත. 2021 වර්ෂයේ මිරිදිය මත්ස්‍ය හා ජලජීවී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 104,450 ක් වූ අතර එය 2020 වර්ෂයේ මෙට්‍රික් ටොන් 102,220 ක නිෂ්පාදනයට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 2,230 ක වැඩිවීමකි.

- තිරසර සංවර්ධන අරමුණු 12 - වගකීමෙන් යුතු පරිභෝජනය සහ නිෂ්පාදනය - ජලාශවල මත්ස්‍ය අස්වැන්න නැවුම් ලෙස ලබා ගත හැකි අතර මෙම මසුන් ජලාශ අවට හෝ ගම තුළ විකුණනු ලැබේ. අතිරික්ත මත්ස්‍ය නිෂ්පාදනය නාගරික වෙළඳපල වෙත නැවුම් ආකාරයකින් පැමිණෙමින් පවතින අතර තව ද මෙම අතිරික්ත නිෂ්පාදනය ගම් මට්ටමින් කරවල සඳහා වේලීම සිදුකරයි. සියලුම ධීවරයින් සහ වගාකරුවන් බලපත්‍රයක් සහිතව ක්‍රියාත්මක වන අතර යහපත් ධීවර කළමනාකරණ පිළිවෙත් අනුගමනය කරයි. සෑම වැදගත් යහපත් කළමනාකරණ පිළිවෙතක්ම රෙගුලාසිවලට පරිවර්තනය කරන ලදී, සහ-කළමනාකරණ පිළිවෙත් හඳුන්වා දීම, වගකිවයුතු ධීවර කටයුතු සඳහා උදාහරණ වේ. එසේම සියලු නව ජලජීවී වගා ව්‍යාපෘති පරිසර හිතකාමී

ප්‍රවේශය භාවිතා කරන අතර මෙය වගකිවයුතු වගාව සහතික කරනු ඇති අතර අවසානයේ වගකීමකින් නිෂ්පාදනයක් ඇති කරනු ඇත.

- තිරසර සංවර්ධන අරමුණු 14 - ජලජ තුල ජීවයඅධික උපයෝජනය, නීති විරෝධී හෝ අනවසර මසුන් ඇල්ලීම, දූෂණය යනාදිය හේතුවෙන් කරදිය මත්ස්‍ය අස්වැන්න ස්ථාවර බැවින් වෙරළබඩ ප්‍රවණතාව වී ඇත්තේ සමුදු ජලජීවී වගාවයි. සමුද්‍ර ජලජීවී වගාව සඳහා පාරිසරික හිතකාමී ප්‍රවේශ වගාව ප්‍රවර්ධනය කිරීම හා වගා පද්ධති සඳහා පරිසර හිතකාමී ද්‍රව්‍ය යොදා ගනී. නොගැඹුරු මුහුදු ප්‍රදේශවල මුහුදු පැලෑටි වගාව ප්‍රවර්ධනය කරන අතර මුහුදු පැලෑටි මුහුදු ජලයේ CO_2 අවශෝෂණය කරයි. මෙය මුහුදු ජලයේ ආම්ලිකතාවය අඩු කිරීමට උපකාරී වේ. පාරිසරික හා කාර්මිකව තිරසාර ආකාරයකින් දරාගතහැකි ධාරිතාව සැලකිල්ලට ගනිමින් සමුද්‍රීය ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය හා පුළුල් කිරීම කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව, විගණනය කරන ලද ගිණුම් සහ විගණකාධිපති වාර්තා සමඟ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබේ.

1. හැඳින්වීම

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ පැවති ජලජීවී වගා අංශය 1998 අංක 53 දරණ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරී පනත මඟින් 1999 ජනවාරි මස 29වන දින පටන් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (නැක්ඩා - NAQDA) බවට පත් කරන ලදි. ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය හි ප්‍රධාන කාර්යාලය අංක. 41/1, නව පාර්ලිමේන්තු පාර, බෙලවත්, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටා ඇත.

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ පාලනය සිදු කරනු ලබයි. අධිකාරිය ප්‍රධාන වශයෙන් අධ්‍යක්ෂ ජනරාල් යටතේ මිරිදිය ජලජීවී වගා සංවර්ධන, වෙරළබඩ ජලජීවී වගා සංවර්ධන, ව්‍යාප්ති, මුදල් සහ මානව සම්පත් සංවර්ධන වශයෙන් අංශ 5කින් හා අධ්‍යක්ෂවරු පස් දෙනෙකුගේ මෙහෙයවීමෙන් ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන (AQDCs)

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මඟින් ප්‍රධාන මිරිදිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන (AQDC) - දහයක් (10), මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන තුනක් (03), විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන දෙකක් (03), බහු විශේෂ මුහුදු වරල් මත්ස්‍ය අභිජනනාගාරය සහ මුහුදු කූඩැල්ලන් අභිජනනාගාරය පහත ආකාරයට පවත්වා ගෙන යනු ලබයි.

මධ්‍යස්ථාන	නිෂ්පාදන විශේෂයන්
උඩවලව (කාප්)	සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප්
දඹුල්ල	සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප් සහ තිලාපියා
ඉහිණියාගල	සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, තිලාපියා
කලාවැව	සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප් සහ තිලාපියා
නුවරඑළිය	සාමාන්‍ය කාපයා
උඩවලව (තිලාපියා)	තිලාපියා විශේෂ
ඉරණමඩුව	සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප්,තිලාපියා
මුරුතවෙල	සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප්, තිලාපියා
නව උඩවලව	සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප්
පොළොන්නරුව	සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප්, තිලාපියා
පම්බල	මිරිදිය ඉස්සන්
තිල්ලවටවන (කහඳමෝදර)	මිරිදිය ඉස්සන්
කල්ලරාව	මිරිදිය ඉස්සන්
රම්බඩගල්ල	විසිතුරු මත්ස්‍ය අභිජනනය සහ වර්ධනය සහ ඉහත විෂයයන් සම්බන්ධව පුහුණු වැඩසටහන් පැවැත්වීම
ගිනිගත්හේන	විසිතුරු මසුන්
සෙවනපිටිය	විසිතුරු මසුන්
බහු විශේෂ මුහුදු වරල් මත්ස්‍ය අභිජනනාගාරය	වරල් මසුන්
ඔලෙයිතුඩුවායි	මුහුදු කූඩැල්ලන්

ඉහත සඳහන් සියලුම මධ්‍යස්ථාන වල සහකාර අධ්‍යක්ෂවරයකු හෝ ජලජීවී විද්‍යාඥවරයකු ස්ථානභාර නිළධාර වශයෙන් කටයුතු කරන අතර, ඔවුන්ගේ වගකීම වන්නේ දිවයින පුරා පිහිටි ජලාශවල තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මත්ස්‍ය බීජ නිෂ්පාදනය කිරීමයි.

කලාවැව - ජාතික මිරිදිය ධීවර සහ ජලජීවී වගා පුහුණු ආයතනය

මෙම ආයතනය ජලජීවී වගා අධිකාරියේ කාර්ය මණ්ඩලය, මිරිදිය ධීවරයන්, මසුන් වගා කරන්නන්, රාජ්‍ය නොවන ආයතන, ප්‍රජා මූලික සංවිධාන සහ උනන්දුවක් දක්වන පාර්ශව සඳහා මිරිදිය ධීවර සහ ජලජීවී වගා ක්ෂේත්‍රයට අදාල පුහුණුවීම් පවත්වනු ලබයි. එයට අමතරව රාජ්‍ය හා පෞද්ගලික ආයතනසඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සැලැස්වීමද සිදුකරන අතර ආයතනය සහකාර අධ්‍යක්ෂ (පුහුණු) යටතේ පාලනය වේ.

ජලජීවී ව්‍යාප්ති සේවාව

ප්‍රාදේශීය ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාල සහ දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාල 22ක් දිවයින පුරා ක්‍රියාත්මක වේ (පළාත් හා දිස්ත්‍රික් මට්ටමින්). ප්‍රාදේශීය/දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරින් ව්‍යාප්ති කටයුතු, රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ කටයුතු , ජලජ සම්පත් කළමනාකරණය එනම් ජලාශවල මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම, ධීවරයින් දැනුවත් කිරීමේ කටයුතු හා අනවසර ධීවර කටයුතු වැලැක්වීම සහ තාක්ෂණය ලබා දීමේ කටයුතු සිදුකරනු ලබයි.

වෙරළබඩ ජලජීවී වගා සංවර්ධනය

වෙරළබඩ ජලජීවී වගා සංවර්ධන අංශය යටතේ වෙරළබඩ ජලජීවී වගා ව්‍යාප්ති හා අධීක්ෂණ ඒකක තුනක්, මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන තුනක්, විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය සහ විසිතුරු මත්ස්‍ය අභිජනන හා පුහුණු මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ. මෙම සියලු මධ්‍යස්ථාන අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂවරුන්, ස්ථාන භාර නිලධාරීගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර ශ්‍රී ලංකාවේ වෙරළබඩ ජලජීවී වගාව සහ විසිතුරු මත්ස්‍ය වගා සංවර්ධනය කිරීමේ වගකීම දරයි.

මිරිදිය ජලජීවී වගා සංවර්ධනය

මිරිදිය ජලජීවී වගා සංවර්ධන අංශය විසින් කළමනාකරණය කරනු ලබන මිරිදිය ජලජීවී වගා මධ්‍යස්ථාන අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂවරුන්, ස්ථාන භාර නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර මත්ස්‍ය බීජ නිෂ්පාදනය සහ ජලාශ, පොකුණු, කූඩු සහ කොටු වල තැන්පත් කිරීමට වගාකරුවන් සඳහා අඛණ්ඩව මත්ස්‍ය බීජ සැපයුමක් පවත්වා ගෙන යාම මූලික වගකීම් වේ. මෙම අංශය විසින් කළමනාකරණය කරනු ලබන ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන 10 ක් ඇත.

2. අරමුණු

නැක්ඩා ආයතනයේ ප්‍රධාන අරමුණ වන්නේ විධිමත් මහපෙන්වීම තුලින් ජලජීවී වගා සංවර්ධනයට අවශ්‍ය රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, පර්යේෂණ සහ සංවර්ධනයන්, පුහුණු කිරීම් හා ව්‍යාප්ති කටයුතු යනාදී ක්‍රමවේදයන් තුලින් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගාවේ තිරසාර සංවර්ධනයයි. මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම තුලින් ආර්ථික සංවර්ධනය, ජනගහනයේ පෝෂණ තත්ත්වය ඉහල නැංවීම,අපනයන වෙළඳපොලට ඉහළ වටිනාකමක් සහිත මත්ස්‍ය විශේෂ ඉදිරිපත් කිරීම සහ රැකියා අවස්ථා බහුල කිරීමෙන් සහ ආදායම් තත්ත්වය ඉහල දැමීම තුලින් දිලිඳුකම අඩුකිරීම නැක්ඩා ආයතනයේ අනෙකුත් අරමුණු වේ.

15/09/2011 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛන අංක 58(2) අනුව ශ්‍රී ලංකා ජාතික ජලජවී වගා සංවර්ධන අධිකාරිය, ප්‍රවර්ධන ආයතනයක් (Promotional Institute)ලෙස වර්ගීකරණය කර ඇත.

03. <u>2021</u> දෙසැම්බර් <u>31</u> දිනට ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ <u>මිනිස් බලය පිළිබඳ තොරතුරු</u>

කාණ්ඩය	**අනුමත සංඛ්‍යාව**	**සිටින සංඛ්‍යාව**	**පුරප්පාඩු සංඛ්‍යාව**
ප්‍රධාන විධායක නිලධාරී	**01**	**01**	**-**
ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන්	**05**	**03**	**02**
මධ්‍ය මට්ටමේ කළමණාකරුවන්	**28**	**26**	**02**
කණිෂ්ඨ මට්ටමේ කළමණාකරුවන්	**100**	**97**	**03**
ජලජීවී විද්‍යාඥයින්	69	69	-
ප්‍රාදේශීය/දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරීන්	20	20	-
සංඛ්‍යාලේඛන නිළධාරීන්	03	03	-
පරිසරක විශ්ලේෂක	01	01	-
මූල්‍ය නිළධාරි	01	01	-
සමාජ සංවර්ධන නිළධාරි	01	01	-
ප්‍රසම්පාදන නිළධාරි	01	01	-
පරිපාලන නිළධාරි	01	01	-
අභ්‍යන්තර විගණන නිළධාරි	01	-	01
විමර්ශන නිළධාරි	01	-	01
භාෂා පරිවර්තක	01	-	01
කළමණාකාර සහකාර - තාක්ෂණික	**141**	**125**	**16**
ජලජීවී වගා සහකාර	23	23	-
ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරීන්	110	98	12
කළමණාකාර සහකාර	03	-	03
තාක්ෂණික නිළධාරීන්	03	02	01
පොත් තබන්නන්	01	01	-
වැඩමුලික	01	01	-
කළමණාකාර සහකාර - තාක්ෂණික නොවන	**82**	**78**	**04**
ප්‍රාථමික මට්ටම	**436**	**390**	**46**
විදුලි/ යන්ත්‍ර කාර්මික	11	09	02
රියදුරු	54	52	02
රසායනාගාර සහායක	03	03	-
සංචාරක බංගලා භාරකරු	08	03	05
සුළු සේවකයින්	360	323	37
එකතුව	**793**	**720**	**73**

එසේම, ජලජීවී වගාව ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා 109 දෙනෙකුගේ (සුළු සේවකයින්) සේවය බාහිර ආයතනයක් හරහා ලබාගෙන ඇත.

4. <u>ප්‍රධාන කාර්යයන්</u>

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යයන් වන්නේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සහ මිරිදිය මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම, රැකියා අවස්ථා බිහි කිරීම, ජලජ සම්පත් ආශ්‍රිත නිෂ්පාදන අපනයන ප්‍රමාණය වැඩි කිරීම ඉලක්ක කර ගෙන ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් සහ ජලජීවී වගා කර්මාන්තයේ තිරසාර සංවර්ධනය සහ කළමනාකරණය කිරීමයි.

5. <u>ප්‍රාග්ධනය</u>

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය 100% ක් භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධනය ආයෝජනය කරනු ලබන රජයේ අයතනයකි. මෙහි අනුමත මුලික ප්‍රාග්ධනය රුපියල් මිලියන 90 කි.

6. <u>ආදායම්</u>

මත්ස්‍ය බීජ විකිණිමෙන්,මධ්‍යස්ථාන බදුදීමෙන් හා අනෙකුත් ආදායම් වශයෙන් අධිකාරිය ලබා ඇති ආදායම රුපියල් මිලියන 339.81 ක් වේ. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම් පියවීම සඳහා භාණ්ඩාගාරයෙන් ලබාදුන් අරමුදල් ප්‍රමාණය රුපියල් මිලියන 493.07ක් වේ.

7. <u>අධිකාරියේ ක්‍රියාකාරකම්</u>

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය රුපියල් මිලියන 32.57 ක ශුද්ධ ලාභයක් ලබා ඇත.

8. <u>කාර්යයන් පිළිබඳ ප්‍රකාශය</u>

2021 දෙසැම්බර් 31 වන දිනට අධිකාරියේ ශේෂ පත්‍රය මූල්‍ය වාර්තාවේ දක්වා ඇත.

9. <u>ප්‍රාග්ධන වියදම්</u>

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙනුවෙන් 2021 වර්ෂයේ දී රුපියල් මිලියන 75.00 ක ප්‍රාග්ධන වියදම් සඳහා මුල්‍ය ප්‍රතිපාදන වෙන්කර දී තිබූ අතර ඉන් රුපියල් මිලියන 50.20 ක් ලබා දී ඇත. මෙම සම්පූර්ණ වෙන් කල ප්‍රතිපාදන භාවිතා කරනු ලැබුවේ මධ්‍යස්ථානවල ඇති ගොඩනැගිලි හා පොකුණු පුනරුත්ථාපනය සහ පිළිසකර කිරීම, ස්ථාවර වත්කම් මිලදි ගැනීම්, වාහන හා උපකරණ අළුත්වැඩියාව සහ ජලජීවී වගා සංවර්ධන කටයුතු සඳහා යෙදවීමටය.

තවද, අධිකාරිය වෙත රු. 2021 වර්ෂය සඳහා ධීවර අමාත්‍යාංශය සහ ධීවර රාජ්‍ය අමාත්‍යාංශය යටතේ මිලියන 1,555.85ක් ලබා දී ඇති අතර එම මුදල් මත්ස්‍ය අභිජනනය හා නිෂ්පාදන ධාරිතාව වැඩිකිරීම, ජලජීවී මධ්‍යස්ථාන අළුත්වැඩියාව හා නඩත්තුව, විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය, නොමිලේ මත්ස්‍ය/ඉස්සන් පැටවුන් තැන්පත් කිරීම, මත්ස්‍ය අභිජනනාගාර ඉදිකිරීම හා අළුත්වැඩියාව, යටිතල පහසුකම් සහිත ජලජීවී ගොවිපළ කලාප සංවර්ධනය, ධීවර ප්‍රජාව සවිබල ගැන්වීම, නව තාක්ෂණය හඳුන්වාදීම සහ ජීවනෝපාය සංවර්ධනය සඳහා වැයකර ඇත.

විදේශ ආධාර යටතේ අධිකාරිය වෙත රු. මිලියන 10.86 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), එක්සත් ජාතීන්ගේ ILO වැඩසටහන සහ ජලජීවී වගා සංවර්ධනය සඳහා ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ සඳහා ඕස්ට්‍රේලියානු මධ්‍යස්ථානය (ACIAR) වෙතින් ජලජීවී වගා සංවර්ධනය සඳහා ලබා දී ඇත.

10. වෙනත් නියෝජිත ආයතන සමඟ සම්බන්ධතා

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ධීවර අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය, සීමාසහිත සී-නෝර් පදනම, පළාත් සභා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධ වී සහයෝගයෙන් කටයුතු කළේය. එසේම පෞද්ගලික අංශය සමඟ එක්ව කිවුල්දිය ඉස්සන් අභිජනනාගාරය, රැකව ඉස්සන් වගා ගොවිපළ සහ වාකරේ ඉස්සන් ගොවිපල ක්‍රියාත්මක කරන ලදි.

11. ආයතනය එළඹ ඇති කොන්ත්‍රාත් කෙරෙහි අධ්‍යක්ෂ වරුන්ගේ මැදිහත් වීම

2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය තුලදී අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ආයතනය එළඹී ඇති කොන්ත්‍රාත්තු සඳහා සෘජුවම හෝ වක්‍රව මැදිහත්වීම් සිදුකොට නැත.

12. විගණකවරු

2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ගිණුම් විගණනය කරනු ලද්දේ රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසිනි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. එෆ්එල්එස්/ඒ/නැක්ඩා/1/එෆ්/ඒ/2021/01
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date 2023 දෙසැම්බර් 06 දින

සභාපති

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යටා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

පිටුව 1 | 15

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 2හි 29 වගන්තිය ප්‍රකාරව සෘජු ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේදී සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ අතිරික්තය සමඟ මෙහෙයුම් ක්‍රියාකාරකම් වල ශුද්ධ මුදල් ප්‍රවාහය සැසඳිය යුතු අතර එය මුදල් ප්‍රවාහයේ කොටසක් ලෙස හෝ මූල්‍ය ප්‍රකාශනවල සටහනක් වශයෙන් පෙන්විය යුතු වුවත් එම හෙළිදරව්ව සිදුකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7හි 47 වගන්තිය පරිදි දේපළ , පිරියත හා උපකරණ වල සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට, වසර 03 කට හෝ වසර 05 කට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, අධිකාරියේ ආරම්භක වර්ෂය වන 1998 වර්ෂයෙන් පසුව කිසිදු ස්ථාවර වත්කමක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණු බැවින් පිරිවැය රු.2,038,838,552ක දේපළ පිරියත උපකරණ හා පිරිවැය හා රු.992,461,882ක් වූ අභිජනනාගාර වත්කම් වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන තුළින් නිරූපනය නොවන බව නිරීක්ෂණය විය.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 8හි 100 වගන්තිය පරිදි වාර්තාකරණ දිනට ඇති සෑම අසම්භාවය වගකීමක්ම හෙළිදරව් කළයුතු වුවත්, අධිකාරියට එරෙහිව කොන්ත්‍රාත්කරුවන් සහ අනිකුත් පාර්ශවයන් අධිකරණයේ ගොනුකර තිබුණු නඩු 11ක් සම්බන්ධයෙන් එලෙස හෙළිදරව් කර නොතිබුණි. තවද ප්‍රමිතියේ 105 වගන්තිය පරිදි වර්තාකරණ දිනට ඇති අසම්භාව්‍ය වත්කම්වල ස්වභාවයෙහි සංක්ෂිප්ත විස්තරයක් සහ ඒවායෙහි මූල්‍ය බලපෑමෙහි ඇස්තමේන්තුවක් හෙළිදරව් කළයුතු වුවත්, අධිකාරිය විසින් මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය සඳහා වගාකරුවන්ට ලබාදී මුදල් අය නොවීම සම්බන්ධයෙන් අධිකරණයේ පවරන ලද නඩු 229ක් සම්බන්ධයෙන් එලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.31,973,196ක් ලැබී තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11හි 95 වගන්තිය ප්‍රකාරව ආදායමක් ලෙස ගිණුම් ගත කර නොතිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ආදායම අඩුවෙන් දක්වා තිබුණි. මීට අමතරව ධීවර අමාත්‍යාංශයෙන් හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, ජාත්‍යන්තර කෘෂි පර්යේෂණ සඳහා ඕස්ට්‍රේලියානු මධ්‍යස්ථානය, ජාත්‍යන්තර කම්කරු සංවිධානය යන ආයතන වලින් විදේශ ප්‍රදාන වශයෙන් ලද රු.1,555,854,461ක් සහ රු.10,864,808ක්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායම් ලෙස ඇතුළත්කර නොතිබුණි.

(ඉ) ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තුමේන්තුවෙන් බදු පදනමට ගෙන භාවිතා කරන අක්කරයක් පමණ වූ මන්නාරම ඔලෙයිතුඩාව මුහුදු කුඩැල්ලන් අභිජනනාගාරයේ ඉඩම රු.800,000ක වටිනාකමකට අවු.30 කාලයකට බදු ගෙන තිබුණ ද එම ඉඩම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 13හි 8 වගන්තිය ප්‍රකාරව ආයෝජන දේපළක් ලෙස ගිණුම්වල හඳුනාගෙන නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 20 හි 57(ඉ) වගන්තිය ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශනවල වෙනම පෙන්විය යුතු වුවත් රු. 5,623,143ක පිරිවැයක් වූ පරිගණක මෘදුකාංගය දේපළ පිරියත උපකරණ යටතේ ගිණුම් කඩා තිබුණි.

(උ) අමාත්‍යාංශ ප්‍රදාන වලින් මිලදී ගෙන ගබඩාවේ පැවති රු.9,186,300 වටිනාකමැති ඖෂධ පිටපත් යන්ත්‍ර, අල්මාරි හා ටැබ් පරිගණක යන අයිතම ජ'නල් සටහන් මඟින් වත්කම් ගිණුම්වලට නැවත වරක් හර කිරීම නිසා ද්විත්ව ගණනයක් සිදුවී තිබුණි.

(ඌ) කලා වැව මධ්‍යස්ථානයේ පැවති ලිපි ද්‍රව්‍ය, රසායනික භෝමෝන, දැල් අමුද්‍රව්‍ය, පොලිතින්, මාළු කෑම සහ ප්‍රධාන කාර්යාලයේ රසායනික භෝමෝන යනාදි රු.5,978,093 ක් වටිනා තොග මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අවසන් තොගයට ඇතුළත් කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට කලාවැව මධ්‍යස්ථානයේ පැවති රු.3,744,591ක් වූ රසායනික භෝමෝන සහ මාළු කෑම, අවසන් තොග ශේෂයට ඇතුළත්ව නොතිබීමෙන් විකුණුම් පිරිවැය එම අගයෙන් වැඩිවී ලාභය අඩුවී තිබුණි.

(ඒ) 2021 දෙසැම්බර් 31 දිනට අංක 090 දරන ජ'නල් සටහන මඟින් ගබඩා තොග ලෙජරයට රු.13,649,343 ක් හර කර රඳවා ගත් ඉපයීම් ගිණුමට බැර කර තිබුණු බැවින් තොග ශේෂය හා රඳවාගත් ඉපයීම් එම වටිනාකමින් අධි ගණනය වී තිබුණු අතර එම ගැළපීම පිළිබඳ සතුටුදායක පැහැදිලි කිරීමක් ජ'නල් සටහනට ඇතුළත්ව නොතිබුණි.

(ඔ) මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය සඳහා දිවි නැගුම ව්‍යාපෘතිය නමින් වක්‍රීය අරමුදලක් පවත්වාගෙන යාම සඳහා අධිකාරිය විසින් 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ප්‍රතිලාභීන් 6450 කට රු.229,035,250ක මුදලක් ලබාදී තිබුණු අතර සාර්ථකවන ප්‍රතිලාභීන්ගෙන් සියයට 50ක් නැවත අයකර ගැනීමටත් අසාර්ථක නම් මුළු මුදලම ආපසු අයකර ගැනීමටත් ගිවිසුමට කොන්දේසි ඇතුළත්ව තිබුණි. මෙම අරමුදල මඟින් ප්‍රතිලාභීන්ට ලබාදුන් ඉහත මුළු මුදල ගිණුම් ගතකර නොතිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභීන්ගෙන් අයවිය යුතු මුදල් පිළිබඳ යවත්කාලීන කරන ලද ණයගැති ලේඛනයක් අධිකාරිය සතුව නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභීන්ගෙන් එකතු කළ මුදල වූ රු.65,967,152ක් ණයභීමියන් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර එම මුදල් කුමන ප්‍රතිලාභියාගෙන් ලැබී තිබුණේද යන්න තහවුරු කරගත හැකි ලිඛිත සාක්ෂි අධිකාරිය සතුව

නොතිබුණි. ලැබීමට ඇති මුදල් අයකර ගැනීම සඳහා 2021 දෙසැම්බර් 31 දිනට අධිකරණයේ පවත්වාගෙන යනු ලබන දිවි නැගුම නඩු ගණන 229ක් විය.

(ඕ) කොන්ත්‍රාත් රැඳවුම් රු.404,958ක් ආපසු ගෙවීමේදී රැඳවුම් ගිණුමට හර කිරීම වෙනුවට වියදම් ගිණුමට හර කිරීම නිසා රඳවාගත් මුදල් ගිණුම එම වටිනාකමින් වැඩිවී තිබුණි.

(ක) නීත්‍යානුකූලව පවරාගෙන නොතිබුණු රජයේ ඉඩම් 07ක් 2012 වර්ෂයේදී රු.44,162,871කට තක්සේරු කර ජංගම නොවන වත්කම් යටතේ ගිණුම් ගතකර තිබුණු අතර මේ දක්වා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ග) 2021 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු වෙත සහතික කළ වැඩ වෙනුවෙන් ගෙවිය යුතු රු.6,561,449ක මුදල ගිණුම් ගතකර නොතිබුණි.

(ච) කොන්ත්‍රාත් 09ක් වෙනුවෙන් වර්ෂය තුළ ගෙවන ලද, වර්ෂ අවසානයේ අයකර නොගත් රු.52,918,504ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් අත්තිකාරම් ගිණුම වෙනුවට කෙරිගෙන යන වැඩ ගිණුමට හර කර තිබුණු බැවින් ජංගම නොවන වත්කම් වැඩියෙන් සහ ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ජ) පුත්තලම දිස්ත්‍රික්කයේ ඉස්සන් වගාව සඳහා භාවිතා කරන ලද කිවුල් ජල පද්ධතියේ ජලයේ ගුණාත්මකභාවය සහ ජල සංසරණය වැඩිදියුණු කිරීම සඳහා සහ ලන්දේසි ඇළ රොන්මඩ ඉවත් කිරීමේ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ගෙවන ලද රු.11,555,152ක අත්තිකාරම් මුදල වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

(ට) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය රු.127,999,387ක් වූවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට අනුව එම ශේෂය රු.127,257,441 ක් විය. ඒ අනුව රු.741,946ක අවිනිශ්චිත ශේෂයක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වෙනස ලෙස යොදා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ මුදල් ශේෂය තුළනය කර තිබුණි.

(ඩ) සමාලෝචිත වර්ෂයේ අත්පිට විකුණුම් සහ වෙළඳ ණයගැතියන්ගෙන් ලද මුදල රු.268,136,206ක් වූවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි එම වටිනාකම රු.60,839,085ක් අඩුවෙන් රු.207,297,121 ලෙස දක්වා තිබුණි.

(ණ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ වර්ෂයේ දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම් ලෙස රු.3,072,393ක් දක්වා තිබුණද, සත්‍ය මිලදී ගැනීම් වටිනාකම රු.48,144,055ක්වූ බැවින් දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම් රු.45,071,662ක් අඩුවෙන් දක්වා තිබුණි.

ජාතික විගණන කාර්යා
தேசிய கணக்காய்வு அலுவல
NATIONAL AUDIT OFF
NAOSL

(ක) කොන්ත්‍රාත්කරුවන් වෙත මුදලින් රු. 635,334,412ක් ගෙවා තිබුණද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ ප්‍රාග්ධනිත කරන ඉදිකිරීම් කොන්ත්‍රාත් ගෙවීම් ලෙස රු.638,117,647ක් දක්වා තිබීම නිසා රු.2,783,235 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ද) ලෙජරය අනුව කොන්ත්‍රාත්කරුවන්ට ගෙවූ රඳවා ගැනීම් මුදල රු.21,525,055ක් වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු.8,228,154ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.13,296,901ක වෙනසක් නිරීක්ෂණය විය.

(න) මාළු ප්‍රවාහන ටැංකි මිලදී ගැනීම සඳහා ගෙවන ලද රු.7, 965,255ක සම්පූර්ණ මුදලම එම ගිණුමට හර කිරීම වෙනුවට සදොස් ලෙස රු.1,940,040ක් වියදම් ගිණුමට හා රු.6,025,215ක් වාහන ගිණුමට හර කර තිබුණි.

(ප) ගෘහ භාණ්ඩ සහ අභිජනනාගාර ටැංකි වැනි මිලදී ගැනීම් සඳහා රු.26,033,920ක් ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එම භාණ්ඩ ගබඩාවට ලැබී නොතිබියදී, අදාළ වත්කම් ගිණුම්වලට හා තොග ගිණුම් වලට හර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය තුළ රු.26,033,920ක වටිනාකමින් අදාළ වත්කම් වැඩිපුර දක්වා තිබුණි.

(බ) සමාලෝචිත වර්ෂය අවසානයේ මධ්‍යස්ථාන රසායනාගාරවල ඉතිරිව පැවති රු.12,589,680ක් වටිනා ඉස්සන්ගේ සුදු පුල්ලි රෝගය පරීක්ෂා කිරීමේ පරීක්ෂණ කට්ටල 30ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වර්ෂ අවසාන තොග ශේෂය ලෙස දක්වා නොතිබුණි.

(ම) 2017,2018 සහ 2019 වර්ෂ තුනට අදාළව දඹුල්ල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයට ලැබුණු ආදායම්වලින් රු.1,628,497ක මුදලක් ස්ථානභාර නිලධාරී හා විෂයභාර කළමනාකරණ සහකාර නිලධාරී විසින් අවභාවිතා කර තිබුණු අතර එම වටිනාකම 2021 වර්ෂය දක්වාම ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණු බැවින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුළ එම වටිනාකමින් රඳවාගත් ඉපයීම් හා ලැබිය යුතු මුදල් අඩුවෙන් දක්වා තිබුණි.

(ය) ධීවර අමාත්‍යාංශය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), ජාත්‍යන්තර කෘෂි පර්යේෂණ සඳහා ඕස්ට්‍රේලියානු මධ්‍යස්ථානය (ACIR), ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) වැනි ආයතනවලින් මත්ස්‍ය අභිජනනය හා ධාරිතාවය වැඩිදියුණු කිරීම, ජලජීවී මධ්‍යස්ථාන නඩත්තු කිරීම, විසිතුරු මත්ස්‍ය කර්මාන්තය වැඩිදියුණු කිරීම, මත්ස්‍ය ඇඟිල්ලන් වැව් තුළට මුදා හැරීම වැනි පුනරාවර්තන කටයුතු සඳහා ලැබී වියදම් කරන ලද රු.916,141,656ක මුදල මූල්‍ය ප්‍රකාශනවල වියදම් ලෙස හෙළිදරව් කර නොතිබුණි.

(ර) 2018 වර්ෂයේ සිට පැවත එන වටිනාකම රු.11,919,216 ක ණයහිමි හර ශේෂ 07ක් සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම බැරකම් යටතේ දක්වා ඇති වටිනාකම රු.5,272,041 ක්වූ ගෙවිය යුතු ශේෂ 14ක් සඳහා , ගෙවිය යුතු නිශ්චිත පුද්ගලයන් සහ එම ශේෂ සනාථ කිරීම සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ල) රු.3,240,483,679ක්වූ ස්ථාවර වත්කම් සඳහා වත්කම් ලේඛනයක් හා උපලේඛනයක් අධිකාරිය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. පවත්වා ගෙන ගොස් තිබුණු මෘදු පිටපතෙහි සඳහන් ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 09 අනුව නොගැළපෙන බැවින් එම වත්කම්වල පැවැත්ම හා නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය.

(ව) සමාලෝචිත වර්ෂයේ මව් මත්ස්‍යයින් 3,899ක් මිය ගොස් තිබුණද එම අලාභ තක්සේරු කර ගිණුම්වල වෙනම හෙළිදරව් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

..3 අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත්විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබා ගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම්

හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තක්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
මු.රෙ. 571(3)	වර්ෂ 2ක් ඉක්මවූ රැඳවුම් මුදල් රු.42,743,400ක් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවීමට හෝ ඔවුන් භීමිකම් නොපන්නේ නම් රාජ්‍ය ආදායමට බැර කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ II කාණ්ඩය XLVIII පරිච්ඡේදය	කළපු සංවර්ධන ව්‍යාපෘතිය යටතේ භාණ්ඩ ජලජ ශාක හා සුන්බුන් ඉවත් කිරීම සඳහා යන්ත්‍ර මිලදී ගැනීම සම්බන්ධ ප්‍රසම්පාදනයේදී යන්ත්‍රය ආනයනය සඳහා දේශීය සැපයුම්කරුට ව්‍යාජ බැඳුම්කරයක් මත 2018 ජූලි මස 13 දින රු.42,572,925ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබීම සම්බන්ධයෙන් කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව ආයතන සංග්‍රහයට අනුව විනය ක්‍රියාමාර්ග ගැනීමට ඉහළ කළමනාකරණය මේ දක්වා කටයුතු කර නොතිබුණු අතර සැපයුම්කරුට එරෙහිවද කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.
(ඇ) 2015 ජූලි 10 දිනැති අංක 2/2015 දරන වාහන අපහරණය පිළිබඳ වක්‍රලේඛය	භාවිතයට නොගන්න වාහන 12ක් වසර 2කට අධික කාලයක් ගතව ඇතත් ඒවා වක්‍රලේඛ ප්‍රකාරව අපහරණය කර නොතිබුණි.
(ඈ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛයේ 6:5:1 උප වගන්තිය	මූල්‍ය ප්‍රකාශන අදාළ මුදල් වර්ෂය ඉකුත් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2021 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2023 පෙබරවාරි 06 දින එනම් මාස 11ක් ප්‍රමාදවී විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. 2022 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන මේ දක්වා ඉදිරිපත් කිරීමට ප්‍රමාද වී තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) අධිකාරිය විසින් දැනට භාවිතා කරන හෙක්ටයාර් 106.3526ක ඉඩම් 19ක්, අක්කර 10 ½ක ඉඩම් 2ක් සහ පර්.62.797ක ඉඩම් 2ක් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් නීත්‍යානුකූල පවරා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ආ) අදාළ ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් අධිකාරියේ ප්‍රයෝජනය සඳහා අමාත්‍යාංශය වෙත භාරදී ඇති හෙක්ටයාර් 137.0294ක මන්නාරම හා වව්නියාව යන ප්‍රදේශවල ඉඩම් 02ක්ද, අක්කර 2 බැගින් මුලතිව් හා යාපනය යන ප්‍රදේශවල ඉඩම් 02ක් සහ පොළොන්නරුවේ පර්චස් 40ක ඉඩමක් මේ වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පවතින බව අනාවරණය විය.

(ඇ) මන්නාරම් දිස්ත්‍රික්කයේ ජලජීවී උයනක් ඉදි කිරීම, මඩකලපු දිස්ත්‍රික්කයේ මාන්කර්නි කකුළු වගා මධ්‍යස්ථානයක් ඉදිකිරීම, පුත්තලම් දිස්ත්‍රික්කයේ මුන්දලමෙති නොප්ලියා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම යන කොන්ත්‍රාත් තුනෙහි යටිතල පහසුකම් සංවර්ධනය හා සැලසුම් කිරීමේ උපදේශන සේවා වෙනුවෙන් 2016,2017 වර්ෂවලදී රු.6,929,664 මුදලක් පෞද්ගලික හා රාජ්‍ය උපදේශන ආයතන දෙකක් වෙත ගෙවා තිබුණද අපේක්ෂිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණු බැවින් නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

(ඈ) 2021 වර්ෂයේ දිවයින පුරා මිරිදිය ජලාශවල මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීමේ අපේක්ෂිත ඉලක්කය මිලියන 167.85ක් වුවද, තත්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම මිලියන 110.79ක් වූයෙන් සියයට 66ක ප්‍රගතියක් විය.

(ඉ) අධිකාරියේ උඩවලව කාෆ්, උඩවලව නව, ඉඹිණියාගල, මුරුතවෙල සහ ඉරණමඩු යන මධ්‍යස්ථාන 05ක පිහිටි වර්ග මීටර් 44,370ක ධාරිතාවයක් සහිත මත්ස්‍ය ටැංකි 2021 වර්ෂයේ දී නිෂ්කාර්යයව පවතින බව නිරීක්ෂණය වූ අතර එය මුළු ධාරිතාවය සමඟ සැසඳීමේදී සියයට 13ක් පමණ ප්‍රතිශතයක් ගෙන තිබුණි. මෙම නිෂ්කාර්ය ටැංකි උපයෝජනය කර ආයතනයේ අරමුණු ලඟා කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2017 වසරේදී රුපියල් මිලියන 142 ක වියදමින් මඩකලපුව දිස්ත්‍රික්කයේ බහු විශේෂ සමුද්‍ර මත්ස්‍ය අභිජනනාගාරය ස්ථාපිත කරන ලද අතර 2017 සිට 2021 වසර දක්වා එහි වැඩිදියුණු කිරීම් හා ප්‍රතිසංස්කරණයන් සිදුකර තිබුණු අතර 2022 සැප්තැම්බර් 08 වන දින අධිකාරියේ ඉංජිනේරුවරයෙකු රු.185,450,000 කට මෙම අභිජනනාගාරය තක්සේරු කර තිබුණි. මේ දක්වා මෙම අභිජනනාගාරය, බහුවිධ කුඩා වරල් මසුන් අභිජනනාගාරයක් ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් තුළින් වෙරළබඩ පවුල් 1600කට ජීවනෝපාය ඇති කිරීම (සෘජු/වක්‍ර) ඉලක්ක ගතකර තිබුණද ප්‍රතිලාභීන් 160 කට පමණක් පහසුකම් සලසා තිබුණු බැවින් පවුල් 1440කට එනම් සියයට 90ක් සඳහා ජීවනෝපාය ඇති කර නොතිබුණි.

(උ) තිලාපියා මත්ස්‍යයන් සඳහා අවශ්‍ය ආහාර නිපදවීමට 2019 ඔක්තෝබර් 08 දින රු.11,802,000 ක් වටිනා මත්ස්‍ය ආහාර නිෂ්පාදන යන්ත්‍රයක් උඩවලව මත්ස්‍ය ආහාර සැකසුම් මධ්‍යස්ථානයේ ස්ථාපිත කර තිබුණු අතර ඒ සඳහා වසර දෙකක වගකීම් කාලයක් ලබා දී තිබුණි. යන්ත්‍රය මගින් ආහාර නිෂ්පාදනය කටයුතු 2021 ජනවාරි 20 දින ආරම්භ කළද 2021 මාර්තු 12 වන දින සිට 2021 සැප්තැම්බර් 24 දින දක්වා යන්ත්‍රය අක්‍රීය වී තිබුණු අතර වගකීම් කාලය වූ වසර දෙකෙන් වැඩි කාලයක් යන්ත්‍රය අක්‍රීයව පැවති බව නිරීක්ෂණය විය. මෙම යන්ත්‍රයෙන් වාර්ෂිකව තිලාපියා මත්ස්‍ය ආහාර කිලෝ ග්‍රෑම් 127,000ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කළද 2021 වර්ෂයේ කිලෝග්‍රෑම් 36,612ක් එනම් සියයට 28ක ප්‍රතිශතයක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. 2021 වර්ෂය සඳහා තිලාපියා මත්ස්‍ය ආහාර කිලෝග්‍රෑම් 91,436 ක් පිටතින් මිලදී ගෙන තිබුණු අතර ඒ සඳහා රු.104,559,426ක් ගෙවා තිබුණි. මේ අනුව මත්ස්‍ය සැකසුම් යන්ත්‍රය අක්‍රීයව පැවතීම හේතුවෙන් මුළු තිලාපියා මත්ස්‍ය ආහාර අවශ්‍යතාවෙන් සියයට 60ක් නිෂ්පාදනය කර ගැනීමට නොහැකිවී තිබුණි.

(ඌ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනයෙහි (UNDP) ප්‍රදාන මඟින් මැදිගිරිය හා වලපනේ යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ජලජීවී වගා සංවර්ධන වැඩසටහන් දියත් කිරීම සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙහි (ILO) ප්‍රදාන මඟින් වෙරළබඩ හා ජලජ සම්පත් සිතියම්ගත කිරීම, ශක්‍යතා විශ්ලේෂණය, වෙරළබඩ හා සමුද්‍ර ජලජීවී වගාව සඳහා පවතින ජීව විද්‍යාත්මක හා රසායනික ප්‍රමිතීන් වාර්තා කිරීම පිළිබඳ උතුරු පළාතේ පුළුල් අධ්‍යනයක් සිදු කිරීම වෙනුවෙන් ලබාදී තිබුණු රු.12,560,048 ක අරමුදල් දෙන ලද කාර්ය සඳහා යොදවා නොගෙන බැංකු ගිණුමේ රඳවාගෙන තිබුණි.

(එ) කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ 2014 අප්‍රේල් 09 දිනැති අංක DMS/1616/VII දරන ලිපිය අනුව ආයතනයේ ඉපයීම් තුළින් වැටුප් ගෙවීමට යටත්ව කෙටිකාලීන පදනම් මත පමණක් කම්කරුවන් තාවකාලිකව බාහිරින් ලබා ගැනීම සුදුසු බවට කර තිබුණු නිරීක්ෂණය වරදවා නිර්වචනය කර ගනිමින් 2021 දෙසැම්බර් 31 දිනට කම්කරුවන් 71 කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන රු.29,312,032ක් අධිකාරියේ ඉපයීම් තුළින් වැටුප් ගෙවා තිබුණි.

(ඒ) ක්‍රියාකාරී සැලැස්ම තුළ වෙන් කරන ලද අරමුදලින් ලන්දේසි ඇළ හැරීම සඳහා සියයට 93ක් යොදවා තිබුණ ද, වාර්ෂික භෞතික ප්‍රගතිය සියයට 30ක් පමණක් බැවින් ව්‍යාපෘතියේ ඉලක්කය සපුරා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඔ) 2021 වර්ෂයේ නොවැම්බර් මස 08 සහ 10 දෙදින තුළ ඇති වූ හදිසි ගංවතුර තත්ත්වය හේතුවෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ හානිවූ ඉස්සන් ගොවිපොළවල් සඳහා රු.49,000,000ක් වන්දි ලෙස ගෙවා තිබුණි. එයට අදාළව පහත සඳහන් නිරීක්ෂණයන් ඉදිරිපත් කෙරේ.

(i) මෙම ගොවිපොළවල ගංවතුර අවස්ථාවේදී සිටිය කීටයන්ගේ සංඛ්‍යාව එහි වටිනාකම ගණනය කළ ආකාරය පැහැදිලි කර නොතිබුණි.

(ii) මෙම ගෙවීම් සිදුකළේ කවර නීතියක්, රීතියක් හෝ රෙගුලාසියක් යටතේද යන්න දක්වා නොතිබුණු අතර මෙම ගොවිපොළ භිමියන් අධිකාරියේ ලියාපදිංචි වී නොතිබුණි.

(iii) පෞද්ගලික රක්ෂණ ඔප්පුවකින් අදාළ ආවරණය කර ගත යුතු මෙම අලාභ රාජ්‍ය අරමුදල්වලින් ගෙවීම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ.

(iv) අධිකාරියේ සභාපතිගේ ලිපිය පරිදි විනාශ වූ පසු කීටයන්ගේ වියදමින් සියයට 50ක මුදලක් ප්‍රධාන මත්ස්‍ය වගා සමාගම් භිමිකරුවන්ට චෙක්පත් මඟින් ලබාදී ඔවුන්ගෙන් ගොවිපොළ භිමියන්ට වන්දි ප්‍රමාණයට සමාන වන පසු කීටයන් ලබා දීම සිදුකර තිබුණි. මත්ස්‍ය වගා සමාගම් විසින් ගොවිපොළ භිමියන්ගේ නමින් කීටයන් නිකුත් කළ ප්‍රවාහන බිල්පත් හා අදාළ ගොවිපොළ භිමිකරුවන් එම පසු කීටයන් ලබාගත් බවට ලබාදෙන ලද මූලික ලියවිලි උපයෝගීකර ගෙන පසු කීටයන් සංඛ්‍යාව තීරණය කර අධිකාරිය විසින් මත්ස්‍ය වගා සමාගම් භිමිකරුවන්ට ගෙවීම් සිදුකර තිබුණි. අධිකාරිය මෙම කීටයන් ලබාදීම පිළිබඳ අධීක්ෂණය කර නොතිබුණු අතර තෙවන පාර්ශවයන්ගේ බිල්පත් මත පදනම්ව ගෙවීම් කර තිබුණි.

(ඕ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රූකව මහඔයට අයත් පුද්ගලික කුඹුරු ඉඩම් අක්කර 42ක් අධිකාරිය විසින් 2017 වර්ෂයේදී මඩ කකුළුවන් (Mud Crabs) වගා කිරීමේ ව්‍යාපෘතියක් ලෙස ඉදිකිරීම් ආරම්භ කර 2020 වර්ෂයේදී අවසන් කර තිබුණි. නමුත් මෙම ව්‍යාපෘතිය අසාර්ථක වීම නිසා ව්‍යාපෘතියේ අරමුණු වෙනස්කර, කිවුල් දිය ඉස්සන් වගාව සඳහා පෞද්ගලික ආයෝජන සමාගමක්, කකුළුවන් වගා කිරීමේ ජලජීවී සංවිධානය හා මෙම අධිකාරිය 2021 දෙසැම්බර් 02 දින ත්‍රෛ පාර්ශවීය බදු ගිවිසුමකට එළඹ තිබුණි. එම ව්‍යාපෘතියට අදාළව පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) අධිකාරිය මූල්‍ය ප්‍රකාශනය අනුව 2021 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.221,719,566ක මුදලක් වැය කර තිබුණද ගිවිසුමේ 10 වන කොන්දේසිය අනුව පෞද්ගලික ආයෝජන සමාගම රු.193,460,000ක් පමණක් වසර 30ක් තුළ බද්දක් ලෙස අධිකාරියට ගෙවිය යුතුව ඇති බැවින් රු.28,259,566ක මූල්‍ය අලාභයක් සිදුවී තිබුණි.

(ii) බදු ගිවිසුමේ 08 වන කොන්දේසිය ප්‍රකාරව වසර 02 ක බදු සහන කාලයක් ආයෝජන සමාගමට ලබා දී තිබුණු අතර බදු ගිවිසුමේ 10 කොන්දේසියට අදාළව ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර තිබුණු බදු ගෙවීමේ ක්‍රමවේදයේ අධිකාරිය වෙත ලැබිය යුතු පළමු වාරික මුදල 2024 දෙසැම්බර් මස 10 හෝ ඊට පෙර ගෙවන බව සඳහන් වී තිබුණි. මේ අනුව බදු නිදහස් කාල සීමාව වසර 02 ක් නොව වසර 03 ක් බවට නිරීක්ෂණය වන අතර බදු ගිවිසුමේ කොන්දේසි එකිනෙකට පරස්පර වන ආකාරයෙන් දක්වා තිබීමද වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(iii) ගිවිසුමේ ඇමුණුම 03 අනුව ආයෝජන සමාගම විසින් බදු ගෙවීම 2024 වර්ෂයේදී ආරම්භ කරන අතර 2024 වර්ෂය දක්වා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර එම වර්ෂයේදී අතහැර දැමුවහොත් අලාභය ප්‍රතිපූර්ණය කර ගැනීමට හැකිවනසේ ඇපකරයක් හෝ වෙනත් නෛතික විධිවිධානයක් ගිවිසුමට ඇතුළත්ව නොතිබුණු බව නිරීක්ෂණය විය.

(iv) බදු ගිවිසුමේ 11 වන කොන්දේසිය ප්‍රකාරව 16 දෙනෙකුගෙන් සමන්විත පොකුණු භිමියන්ගේ සංගමයේ එක් එක් සාමාජිකයින්ට ආයෝජන සමාගම විසින් ගෙවීම සඳහා ඒ ඒ වර්ෂයන්ට අදාළ බදු මුදල ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර තිබුණි. එම ඇමුණුමට අනුව පළමු අවුරුදු 5 ඇතුළත එක් එක් වර්ෂයට රු. 400,000 බැගින්ද දෙවන පස් අවුරුදු කාලය තුළ සියයට 10 බැගින් එම මුදල වැඩිවන පරිදි ගෙවිය යුතුය. ඒ අනුව ඒ ආකාරයෙන් ගෙවිය යුතු මුළු බදු මුදල රු.7,040,000ක් වූවද රු.3,000,000ක් අඩුවෙන් එනම් රු.4,040,000ක් ඇමුණුමෙහි දක්වා තිබුණි.

(v) ආයෝජන සමාගම විසින් මූලික ප්‍රාග්ධනය ලෙස පළමු වන වර්ෂයේදී රු.72,000,000ක් හා දෙවන වර්ශයේදී රු.100,500,000 යොදවන බව මූල්‍ය යෝජනාව අනුව දක්වා තිබුණි. ඒ අනුව යොදවන ලද මූලික ප්‍රාග්ධනය මණින් සිදු කරනු ලබන කාර්යයන් මොනවාද, එහි පිරිවැය ඇස්තමේන්තුව, වැඩ සැලැස්මක් හෝ ගිවිසුමේ හෝ අමුණා නොතිබුණි. තවද, අධිකාරිය විසින් මෙම ප්‍රාග්ධනය ලැබෙන බවට තහවුරුවක් ලබාගෙන නොතිබුණි.

(vi) බදු මුදල ලෙස ඉදිරි වසර 30 තුළ ආයෝජන සමාගමෙන් අය කිරීමට අපේක්ෂා කරන රු.193,460,000ක මුදලේ ශුද්ධ වර්තමාන අගය රු. 69,120,470 ක් බැවින් ව්‍යාපෘතියේ අනාගත මුදල් ප්‍රවාහය සමඟ සැසඳීමේදි රු.124,339,530 ක මූල්‍ය අලාභයක්ද සිදුවන බව නිරීක්ෂණය වේ. (වට්ටම් අනුපාතය = පසුගිය වසර 10 ක (2012-2021) භාණ්ඩාගාර බිල්පත් අනුපාතයේ සමාන්‍ය අගය - 8.53% - මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහා බැංකු වාර්ෂික වාර්තාව 2021). තවද, ඉහත (i) හි නිරීක්ෂණයේ ඇති රු.28,259,566ක මූල්‍ය අලාභයද සමඟ සමස්ත මූල්‍ය අලාභය රු.152,599,096ක් අධිකාරියට සිදුවන වන අතර මෙම මූල්‍ය අලාභයට සෘජුව මෙයට සම්බන්ධ අධිකාරියේ නිලධාරීන් වගකිව යුතු බව නිරීක්ෂණය කෙරේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(vii) 2006 අංක 23 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි (සංශෝධන) පනතේ 5.4(උ) ප්‍රකාරව ජලජ සම්පත් ආනයනකරුවකු, අපනයනකරුවකු, අලෙවිකරුවකු, සපයන්නෙකු හා බෙදාහරින්නකු ලෙස ව්‍යාපාර කරගෙන යාම අධිකාරියේ කර්තව්‍ය වන අතර ඒ අනුව කටයුතු නොකර ඉහත පරිදි අධිකාරියට මූල්‍ය අලාභයන් සිදුවන ලෙස පෞද්ගලික ආයෝජන සමාගමක් සමඟ ගිවිසුම්ගත වීම තුළින් පනත මඟින් අධිකාරිය වෙත පැවරී ඇති කාර්යය හා කර්තව්‍ය බාහිර පාර්ශවයන්ට පවරා ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය කෙරේ.

(ක) ප්‍රාග්ධන ප්‍රදාන මඟින් ඉදිකරන ලද සුන්දර තොටුපල ව්‍යාපෘතියේ පිරිවැය වූ රු.27,659,046ක් පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර එය ධීවර සමිති වෙත පවරා තිබුණු බව සටහනක් මඟින් අනාවරණය කර ඇතත්, පැවරීම සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය, අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව හා ධීවර සමිතිවලට නීත්‍යානුකූලව පැවරීමට අදාළ කිසිදු ලියවිල්ලක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

ආදායම් ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

	සටහන	වර්ෂ 2021	වර්ෂ 2020
		රු.	රු.
ආදායම	03	276,155,266.20	153,927,489
විකුණුම් පිරිවැය	04	(257,896,977.68)	(223,527,832)
දළ ලාභය		**18,258,288.52**	**(69,600,343)**
භාණ්ඩාගාර ප්‍රදාන- පුනරාවර්ථන ප්‍රදාන		493,067,000.00	495,500,000
පුනරාවර්ථන ස්වරූප වියදම් සඳහා යොදාගන්නා ලද ප්‍රාග්ධන ප්‍රදාන		23,978,523.82	64,741,226
වෙනත් ආදායම්	05	63,659,698.39	60,712,786
ජීව තොග අගයකිරීමේ ලාභ/(අලාභ)		(253,050.00)	324,050
අඩමාන ණය අධිවෙන්කිරීම		1,643,574.27	-
ශුද්ධ මෙහෙයුම් ආදායම		**600,354,035.00**	**551,677,719**
පරිපාලන වියදම්	06	(722,535,212.12)	(673,040,147)
බෙදාහැරීමේ වියදම්	07	(102,349,817.27)	(112,977,781)
මූල්‍ය වියදම්	08	(208,883.60)	(97,526)
ලාභ / (අලාභ) විලම්භිත ආදායම් ගැලපීමට පෙර		**(224,739,877.99)**	**(234,437,735)**
ප්‍රවර්ථන වර්ශයෙ වලමහත ආදායම ලාභාලාභ ගිණුමට ලියා හැරීම		257,307,581.99	191,268,398
වර්ෂය තුල ලාභ / (අලාභ)		**32,567,704.00**	**(43,169,337)**

❖ සටහන් අංක 1 සිට 21 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් සහ 1 සිට 5 දක්වා ඇති උපලේඛන මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි කොටසකි

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

ආදායම් විස්තීර්ණ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

	සටහන	වර්ෂ 2021	වර්ෂ 2020
		රු.	රු.
වර්ෂය තුල ලාභ / අලාභ		32,567,704.00	(43,169,337.01)
අනෙකුත් විස්තීර්ණ ආදායම්/වියදම් අය බදු			
අනෙකුත් විස්තීරණ අදායම් වර්ෂය සඳහා		0.00	0.00
මුළු විස්තීරණ අදායම වර්ෂය සඳහා		**32,567,704.00**	**(43,169,337.01)**

සටහන් අංක 1 සිට 21 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම් සටහන් සහ 1 සිට 5 දක්වා ඇති උපලේඛන මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි කොටසකි.

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
2021 දෙසැම්බර් 31 දිනට

	සටහන	වර්ෂ 2021	වර්ෂ 2020
		රු.	රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	9	2,379,370,554.93	2,273,357,553
අභිජනන හා වෙළඳ වත්කම්	10	993,956,149.28	957,094,148
ජීව වත්කම්	11	16,539,296.00	18,654,800
කෙරිගෙන යන වැඩ	12	537,882,828.07	184,963,062
අනෙකුත් ජංගම නොවන වත්කම්	13	221,719,566.45	221,719,566
		4,149,468,394.73	3,655,789,129.34
ජංගම වත්කම්			
තොග	14	75,315,328.57	37,781,566
තැන්පත්, අත්තිකාරම් හා කලින් ගෙවීම්	15	5,422,544.64	12,885,958
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	16	130,223,573.20	123,074,883
අතැති මුදල් සහ බැංකුවේ මුදල්	17	127,999,386.54	97,088,289
		338,960,832.95	270,830,698
මුළු වත්කම්		4,488,429,227.68	3,926,619,827
ස්කන්ධය			
ප්‍රාග්ධන හා සංචිත			
භාණ්ඩාගාර ප්‍රතිපාදන		528,878,007.47	178,248,259
රඳවාගත් ඉපැයීම්		(132,751,687.64)	(174,255,506)
වත්කම් ප්‍රත්‍යාගණන සංචිත		17,400,000.00	17,400,000
මුළු ස්කන්ධය		413,526,319.83	21,392,753
බැරකම්			
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	18	151,112,102.08	145,065,110
විලම්බිත ආදායම්	19	3,617,995,963.06	3,473,766,460
රාජය ප්‍රදාන	20	54,040,042.00	54,040,042
		3,823,148,107.14	3,672,871,612
ජංගම බැරකම්			
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ	21	174,616,904.19	165,500,594
කොන්ත්‍රාත් මත රඳවා ගැනීම්		77,137,896.52	66,854,868
		251,754,800.71	232,355,462
මුළු බැරකම්		4,074,902,907.85	3,905,227,074
මුළු ස්කන්ධය හා බැරකම්		4,488,429,227.68	3,926,619,827

සටහන් අංක 1 සිට 21 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම් සටහන් සහ 1 සිට 5 දක්වා ඇති උපලේඛන මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි කොටසකි.

.....
ඒ එම් එන් එස් බණ්ඩාරනායක
අධ්‍යක්ෂ මුදල්

.....
ආචාර්ය ජේ එම් අසෝකා
අධ්‍යක්ෂ ජනරාල්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

.....
ජයන්ත විජේරත්න
සභාපති

.....
ටී ර් ඩී ධම්මික ප්‍රේමරත්න
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

	සටහන	පුනරාවර්ථන ප්‍රදාන රු.	ප්‍රාග්ධන ප්‍රදාන රු.	වත්කම් ප්‍රත්‍යාගණන රු.	රඳවාගත් ඉපැයීම් රු.	එකතුව රු.
2020 ජනවාරි 01 දිනට ශේෂය		0.00	801,131,975.40	17,400,000.00	(131,016,682.40)	687,515,293.00
කාලපරිච්ඡේදයට ලද ප්‍රදාන - පුනරාවර්ථන/ප්‍රාග්ධන		495,500,000.00	196,200,000.00	0.00	0.00	691,700,000.00
ප්‍රාග්ධනිත වත්කම් සඳහා භාවිතා කල අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන		0.00	258,651,930.43	0.00	0.00	258,651,930.43
ප්‍රවර්ථන වර්ෂයේ විලම්භිත ආදයම් මාරු කිරීම්-ප්‍රාග්ධන (වත්කම් එකතුකිරීම්)	10	0.00	(28,782,702.52)	0.00	0.00	(28,782,702.52)
ප්‍රවර්ථන වර්ෂයේ විලම්භිත ආදයම් මාරු කිරීම්-ප්‍රාග්ධන (ඉදිකිරීම්)	Sch-01	0.00	(159,719,557.51)	0.00	0.00	(159,719,557.51)
ප්‍රවර්ථන වර්ෂයේ විලම්භිත ආදයම් මාරු කිරීම්-අමාත්‍යාංශ ප්‍රාග්ධන (ඉදිකිරීම්)	Sch-01	0.00	(802,368,251.47)	0.00	0.00	(802,368,251.47)
පුනරාවර්ථන ප්‍රදාන ලාභඋලාභ ගිණුමට මාරු කිරීම		(495,500,000.00)	0.00	0.00	0.00	(495,500,000.00)
ප්‍රාග්ධන නොවන වියදම් සඳහා දරණ ලද ප්‍රාග්ධන ප්‍රදාන		0.00	(64,741,225.85)	0.00	0.00	(64,741,225.85)
වත්කම් පැවරීම - සුන්දර තොටුපල	N-1	0.00	(27,659,046.44)	0.00	0.00	(27,659,046.44)
පෙර වර්ෂ ගැලපුම්	N-2	0.00	5,535,136.88	0.00	(69,486.50)	5,465,650.38
කාලපරිච්ඡේදයට අදාල ලාභය/(අලාභය)		0.00	0.00	0.00	(43,169,337.01)	(43,169,337.01)
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය		-	178,248,258.92	17,400,000.00	(174,255,505.91)	21,392,753.01

2021 ජනවාරි 01 දිනට ශේෂය		0.00	178,248,258.92	17,400,000.00	(174,255,505.91)	21,392,753.01
කාලපරිච්ඡේදයට ලද ප්‍රදාන - පුනරාවර්ථන/ප්‍රාග්ධන		493,067,000.00	50,167,000.00	0.00	0.00	543,234,000.00
ප්‍රාග්ධනිත වත්කම් සඳහා භාවිතා කල අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන		0.00	657,935,575.86	0.00	0.00	657,935,575.86
ප්‍රවර්ථන වර්ෂයේ විලම්භිත ආදයම් මාරු කිරීම්-ප්‍රාග්ධන (වත්කම් එකතුකිරීම්)	10	0.00	(22,919,004.33)	0.00	0.00	(22,919,004.33)
ප්‍රවර්ථන වර්ෂයේ විලම්භිත ආදයම් මාරු කිරීම්-ප්‍රාග්ධන (ඉදිකිරීම්)	Sch-01	0.00	(20,451,222.30)	0.00	0.00	(20,451,222.30)
ප්‍රවර්ථන වර්ෂයේ විලම්භිත ආදයම් මාරු කිරීම්-අමාත්‍යාංශ ප්‍රාග්ධන (ඉදිකිරීම්)	Sch-01	0.00	(293,618,779.97)	0.00	0.00	(293,618,779.97)
පුනරාවර්ථන ප්‍රදාන ලාභෘලාභ ගිණුමට මාරු කිරීම		(493,067,000.00)	0.00	0.00	0.00	(493,067,000.00)
ප්‍රාග්ධන නොවන වියදම් සඳහා දරණ ලද ප්‍රාග්ධන ප්‍රදාන		0.00	(23,978,523.82)	0.00	0.00	(23,978,523.82)
වත්කම් පැවරීම - සුන්දර තොටුපල		0.00	0.00	0.00	0.00	0.00
පෙර වර්ෂ ගැලපුම්		0.00	3,494,703.11	0.00	8,936,114.27	12,430,817.38
කාලපරිච්ඡේදයට අදාල ලාභය/(අලාභය)		0.00	0.00	0.00	32,567,704.00	32,567,704.00
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය		-	528,878,007.47	17,400,000.00	(132,751,687.64)	413,526,319.83

සටහන් අංක 1 සිට 21 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම් සටහන් සහ 1 සිට 5 දක්වා ඇති උපලේඛන මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි කොටසකි.
** තක්සේරු අරමුදල සමන්විතව ඇත්තේ 2012 වර්ෂයේ කත්සේරු කල ඉඩම් දෙකක (කලාවැව හා කහදමෝදර) තක්සේරු වටිනාකම් වේ.*
** සටහන් 02 - පෙර වර්ෂයේ, ණයගැතිගෙන් එකතු කල මුදල ආදායම් ගිණුමට හඳුනාගත් අතර ඒ අනුව ණයගැති ගිණුම් ද සංශෝධනය කර ඇත.*

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

	සටහන	වර්ෂ 2021 රු.	වර්ෂ 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය			
මත්ස්‍ය පැටවුන් විකුණුම් ආදායම		207,297,121.10	77,352,344.30
භාණ්ඩාගාර ප්‍රදාන- පුනරාවර්ථන ප්‍රදාන		493,067,000.00	503,323,000.00
වෙනත් ආදායම්		59,484,626.83	44,357,464.61
අමාත්‍යාංශ හා වෙනත් ලැබීම්		593,227,216.47	447,950,423.23
වෙනත් ලැබීම්		132,471,712.71	230,880,930.89
		1,485,547,677.11	1,303,864,163.03
ගෙවීම්			
පරිපාලන වියදම්		(209,287,444.32)	(153,094,077.43)
විශ්‍රාම පාරිතෝෂික		(7,135,879.70)	(3,341,610.15)
වෙනත්		(766,407,308.48)	(916,800,834.44)
අමාත්‍යාංශ හා වෙනත් ප්‍රදාන ව්‍යාපෘති හා වෙනත් ගෙවීම් සඳහා භාවිතා කිරි		(872,226,697.11)	(296,018,243.41)
මෙහෙයුම් කටයුතු වලින් උපයන ලද මුදල්		(1,855,057,329.61)	(1,369,254,765.43)
කාරක ප්‍රාග්ධන ගැලපීමට පෙර මෙහෙයුම් ලාභය		(369,509,652.50)	(65,390,602.40)
ආයෝජන ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය			
දේපල පිරියත හා උපකරණ මිලට ගැනුම්		(3,072,392.51)	(19,464,097.52)
ප්‍රාග්ධනිත වත්කම් හා අනකෙුත් ව්‍යාපෘතිය - අමාත්‍යාංශ		(627,675,521.20)	(367,349,921.77)
ප්‍රාග්ධනිත වත්කම් (ඍජු භාණ්ඩාගාර ප්‍රාග්ධන ලැබීම්)		(10,442,126.15)	(107,655,046.73)
නොනිමි වැඩ			0.00
ව්‍යාපෘති සඳහා භාවිතා කරනු ලබන අමාත්‍යාංශ ප්‍රදාන			0.00
රඳවාගත් මුදල් නිදහස් කිරීම		(8,228,154.05)	(3,683,211.14)
ආයෝජන ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහය		(649,418,193.91)	(498,152,277.16)
මූල්‍ය කටයුතු මත මුදල් ප්‍රවාහය			
භාණ්ඩාගාර ප්‍රතිපාදන - ප්‍රාග්ධන		50,167,000.00	196,200,000.00
ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම් (අමාත්‍යාංශය)		998,929,997.31	383,593,189.52
මූල්‍ය ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහය		1,049,096,997.31	579,793,189.52
මුදල්, මුදල් හා සමාන අයිතමයන්ගේ වූ ශුද්ධ වැඩිවීම් / අඩුවීම්		30,169,150.90	16,250,309.96
මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනස		741,946.33	0.00
වර්ෂ ආරම්භක මුදල් හා මුදල් හා සමාන අයිතමයන්ගේ වටිනාකම		97,088,289.31	80,837,979.35
වර්ෂ අවසාන මුදල් හා මුදල් හා සමාන අයිතමයන්ගේ වටිනාකම		127,999,386.54	97,088,290.31
මුදල්, මුදල් හා සමාන අයිතමයන්ගේ විශ්ලේෂණය			
වර්ෂ අවසානයට			
බැංකු ශේෂය (බැංකුවේ ඇති මුදල්)		127,999,001.54	97,088,289.31
මුදල් ශේෂය(අතැති මුදල්)		385.00	0.00
		127,999,386.54	97,088,289.31

සටහන් අංක 1 සිට 21 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම් සටහන් සහ 1 සිට 5 දක්වා ඇති උපලේඛන මෙම මූල්‍ය ප්‍රකාශනයේ කොටසකි.

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. සංස්ථාපනය කිරීමේ තොරතුරු

1.1 පොදු කරුණු

1998 අංක 53 දරණ පනතින් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ස්ථාපිත කර ඇති අතර ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ නියමයන්ට යටත් වේ. අධිකාරියේ ප්‍රධාන කාර්යාලය 41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල.

1.2 ප්‍රධාන කර්තව්‍ය හා මෙහෙයුම් ස්වභාවය

වර්ෂය තුල අධිකාරියෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ ,

- මත්ස්ය නිෂ්පාදනය හා මාළු පරිභෝජනය ඉහළ නැංවීම සඳහා ජලජීවී වගාව හා ජලජීවී කටයුතු සංවර්ධනය කිරීම.
- මිරිදිය හා වෙරළ ආශ්‍රිත ජලජීවී වගාව සංවර්ධනය කිරීම තුලින් රැකියා අවස්ථා නිර්මාණය කිරීම.
- අපනයනය සඳහා විසිතුරු මසුන් ඇතුළු ඉහළ වටිනාකමින් යුත් විශේෂ වල ගොවිතැන ප්‍රවර්ධනය කිරීම.
- පරිසර හිතකාමී ජලජීවී භාවිතය තුලින් ජලජ සම්පත් ප්‍රශස්තව උපයෝගී කරගැනීම.
- කුඩා, මධ්‍ය පරිමාණ හා විශාල පරිමාණ පුද්ගලික අංශයේ ජලජීවී වගාව ප්‍රවර්ධනය කිරීම හා ස්ථාපනය කිරීම.
- දුර්වල ජලජීවී වගාවන් මගින් විනාශයට පත් ජලජ සම්පත් සංරක්ෂණය හා පුනරුත්ථාපනය කිරීම.

1.3 නිකුත් කිරීම සඳහා බලය ලබා දෙන දිනය

අලුතින් සකස් කරන ලද ගිණුම්කරණ ප්‍රමිතියේ හෝ නීතියේ පූර්ණ හෝ කොටසක් සම්මත කර ගැනීමට අධිකාරිය බැඳෙන තෙක් හෝ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද තෙක් මෙම ගිණුම්කරණ ප්‍රතිපත්තීන් 2017/01/01 දින සිට තවදුරටත් වලංගුවේ.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරංශය

2.1 මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීමේ පදනම

මෙම ගිණුම් වර්තා පිළියෙල කර ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම මත වේ. කාලපරිච්ඡේදයේ තක්සේරු කිරීමේදී පිළිබිඹු වන උද්ධමන වත්කම් සඳහා කිසිදු ගැලපීමක් සිදු නොකෙරේ.

2.2 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියල කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කරන ලද රාජ්‍ය අංශයේ ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව හා 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන වලට අනුකූලව වේ.

2.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ බැංකුවෙහි ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින්ය .

2.4 සංසන්දනාත්මක තොරතුරු

අධිකාරිය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් නිශ්චිතවම අඛණ්ඩව භාවිතා කර ඇති අතර, වෙනත් ආකාරයකින් ප්‍රකාශිත නැත්නම් පෙර වර්ෂයේ භාවිතා කළ ඒවා සමඟ අනුකූල වේ.

2.5 ප්‍රමාණාත්මකතාවය සහ සමාහරණය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ට අනුකූලව මූල්‍ය ප්‍රකාශනයේ ප්‍රමාණාත්මකව සමාන අයිතමයන් වෙන් වෙන් වශයෙන් මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇත. අසමාන අයිතමයන් ස්වභාවය සහ ක්‍රියාකාරිත්වය අනුව, ප්‍රමාණාත්මක නම් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කර ඇත. මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් පියවා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයන්හි ශුද්ධ මුදල් ප්‍රමාණය වාර්තා කර ඇත, එනම් එම හදුනාගත් අගය හිලව් කිරීමට නීත්‍යානුකූලව බලයක් ඇති විට හා එහි අභිප්‍රය වන්නේ ශුද්ධ පදනම මත පියවීමට හෝ වත්කම් සාක්ෂාත් කර ගැනීමට සහ වගකීම එකවර පියවීමට වේ. කිසියම් ගිණුම්කරණ ප්‍රමිතියක හෝ අර්ථකථනයක අවශ්‍යතාවයක් හෝ අවසර දී ඇති සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විශේෂයෙන් අනාවරණය කර නොමැති නම් ආදායම් ප්‍රකාශයේ ආදායම සහ වියදම් හිලව් නොකර පෙන්වා ඇත.

2.6 ප්‍රාග්ධන සහ පුනරාවර්තන ප්‍රදාන

මූල්‍ය නොවන ප්‍රදාන ඇතුළුව රජයේ ප්‍රදාන සාධාරණ සහතිකයක් ඇති විට "ආදායම් ප්‍රවේශය" මත පදනම් ව සාධාරණ වටිනාකමකින් හදුනාගෙන ඇත.

(අ) ආයතනය ඒවාට අනුයුක්ත කරන කොන්දේසි වලට අනුකූල වේ ; හා
(ආ) ප්‍රදාන ලැබෙනු ඇත.

රජ්‍ය ප්‍රදානය මුදල් වශයෙන් නැතහොත් රජයට වගකීමක් / ණයක් අඩු කිරීමක් ලෙස ලැබුණද රජයේ ප්‍රදාන එකම ක්‍රමවේදයට ගිණුම්ගත කර ඇත.
රජයේ ප්‍රදාන ක්‍රමානුකූල පදනමක් මත කාල සීමාවන් තුළ දී ලාභ හෝ අලාභ ලෙස ප්‍රදානයන්ට අදාල වියදම් එහි වියදම් ලෙස හදුනාගෙන ඇත. ක්ෂය කළ හැකි වත්කම්වලට අදාළ ප්‍රදාන, එම වත්කම්වල ක්ෂයවීම් වියදම් අදාල කාල සීමාවන් තුළ ලාභයට හෝ අලාභයට හදුනා ගනු ලැබේ.

2.7 වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ

බොල්ණය සහ අඩමාන ණය සඳහා වෙන් කිරීමෙන් පසු ඇස්තමේන්තු ශුද්ධ ඉපැයීම් වටිනාකම වෙළඳ මත ලැබිය යුතු දෑ ලෙස සඳහන් වේ. වෙනත් ලැබීම් පිරිවැයට හඳුනාගෙන ඇත.

2.8 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

NAQDA වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පරිගණක ගිණුම්කරණ පැකේජය භාවිතයෙන් සිදු කරනු ලබන අතර 2021 වසරේ සිට ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට (SLPSAS 2) අනුකූලව ‘‘සෘජු ක්‍රමය’’ භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇති අතර පරිගණක පද්ධතිය මඟින් සෘජු ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශය උත්පාදනය කර ඇත.

2.9 දේපල, පිරියත හා උපකරණ

ඉඩම් හර අනෙකුත් සියලුම වත්කම් පිරිවැයෙන් සම්මුච්චිත ක්ෂය අඩුකිරීමෙන් පසු ශුද්ධ වටිනාකම පෙන්නුම් කර ඇත.
වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පුරාවට සරල මාර්ගික පදනමට ක්ෂය වීම ගණනය කරනු ලැබේ. ක්ෂය කිරීම් අනුපාතය පහත පරිදි වේ.

ගොඩනැගිලි හා ඉදිකිරීම්	4%
වාහන	20%
ලී බඩු හා කාර්යාලීය උපකරණ	10%
රසායනාගාර උපකරණ	10%
යාන්ත්‍රික හා වෙනත් උපකරණ	10%
රක්නාගාර	10%
මාලු ටැංකි	10%
මාලු තටාක	6%
උපකරණ හා උපාංග	10%
පරිසණක හා සංනිවේදන හුවමාරු උපකරණ	20%
පරිසණක මෘදුකාංග	10%

2.9.1 රසායනාගාර උපකරණ සහ පරිගණක මෘදුකාංග ක්ෂයවීමේ අනුපාතය වත්කම් වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් කාලය හදුනාගෙන ඇති අතර තාක්ෂණික යල්පැනයාම නොසලකා හැරේ.

2.10 අඩමාන ණය

2012 - 2016 ණයගැති ශේෂයෙන් 10% ක ප්‍රතිපාදන සහ 2010,2011 වර්ෂය සඳහා පූර්ණ ප්‍රතිපාදන ණයගැතියන් සම්බන්ධයෙන් අඩමානණය ලෙස ප්‍රතිපාදනය සිදු කර ඇත. වසර තුළ අඩමාන ණය අධි/ඌණ වෙන්කිරීම ලාභාලාභ ගිණුමට ගලපා ඇත.

2.11 ජීව විද්‍යාත්මක තොග

- වර්ෂය තුල මත්ස්‍ය බීජ, විසිතුරු මත්ස්‍ය, සහ මිරිදිය ඉස්සන් හා ඉස්සන් විතුණුම් වටිනාකම (සාධාරණ වටිනාකම) හෝ ශුද්ධ උපලබ්දී අගය යන දෙකෙහි අඩු වටිනාකමට ගණනය කර ඇත.

- මව් මසුන් තොග (ආහාර මාළු) ඔවුන්ගේ මස් බර සහ මස් විකුණුම් (සාධාරණ) වටිනාකම මත (SLPSAS 18 - කෘෂිකර්මයේ 34 වගන්තියට අනුව) සාධාරණ වටිනාකමින් සමුච්චිත ක්ෂය අඩුකිරීම නිවැරදි ගණනය කිරීමක් නොවේ හා මව් මසුන් සඳහාම වෙළඳපල වටිනාකමක් ද නොමැත.

2.12 විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිලාභ

<u>ප්‍රතිලාභ සැලැස්ම අර්ථ දැක්වීම - පාරිතෝෂික</u>

සේවයේ ආරම්භක දින සිට එක් එක් සේවා වසර වෙනුවෙන් මාසික වැටුපෙන් ½ දීමනාවක් පාරිතෝෂික ලෙස වෙන්කර ඇත.

කෙසේ වෙතත්,1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතට අනුව,සේවකයකු පාරිතෝෂිකයක් ලැබීම සඳහා බැඳෙනුයේ අධිකාරියේ අඛණ්ඩව වසර 5 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුවය.

<u>දායකත්ව සැලැස්ම අර්ථ දැක්වීම– සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල</u>

සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා අදාළ වන ව්‍යවස්ථාවන් හා රෙගුලාසි වලට අනුකූලව සේවකයින් සුදුසුකම් ලබයි. අධිකාරිය විසින් සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල වෙත සේවකයින්ගේ දළ වැටුපෙන් පිළිවෙළින් 15% ක් සහ 3% ක දායකත්වයක්.

2.13 වියදම් හඳුනා ගැනීම

වියදම්, පිරිවැය හා උපයනු ලබන ආදායම අතර සෘජු සම්බන්ධතාවයක් මත ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ. නිෂ්පාදනය පවත්වා ගෙන යාම සහ දේපල, යන්ත්‍රෝපකරණ කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා දරණ ලද මුළු වියදම ආදායමට ගලපා කාලපරිජේදයට අදාල ලාභය/(අලාභය) ගණනය කර ඇත.

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම් සටහන්

		31/12/2021 රු.	31/12/2020 රු.
03	**ඉපැයීම්**		
	6301- 1 ණයට විකුණුම් (මත්ස්‍ය බීජ)	54,556,324.50	63,180,394.80
	6301- 1 අත්පිට විකුණුම් (මත්ස්‍ය බීජ)	221,598,941.70	90,747,094.42
	එකතුව	**276,155,266.20**	**153,927,489.22**
04	**විකුණුම් පිරිවැය**		
	01.01 දිනට තොගය		
	මත්ස්‍ය බීජ	12,003,600.00	6,544,968.75
		12,003,600.00	6,544,968.75
	එකතු කලා - ඍජු වියදම්		
2105	මවු මසුන් වැඩිදියුණු කිරීම	13,093,981.10	20,722,703.75
	මව් මත්ස්‍ය ආගණනය	1,862,453.50	2,740,000.63
	මත්ස්‍ය බීජ පරිභෝජනය		
	ඉදිරියට ගෙන ආ ශේෂය 01.01	4,555,467.28	8,386,700.50
1304	එකතු කලා-මිලදී ගැනීම්	104,559,425.80	76,188,158.67
3102	අඩුකලා - 12.31දිනට තොගය	- 24,571,396.78	(4,555,467.28)
1304		84,543,496.30	80,019,391.89
	හෝර්මෝන, රසායනික ද්‍රව්‍ය, ඔක්සිජන්		
	ඉදිරියට ගෙන ආ ශේෂය 01.01	9,385,031.26	10,054,037.21
1305	එකතු කලා-මිලදී ගැනීම්	18,060,653.02	12,985,109.83
3103	අඩුකලා - තොගය 12.31 දිනට	(16,258,929.76)	(9,385,031.26)
1305		11,186,754.52	13,654,115.78
	අභිජනන ක්‍රියාවලියේ පොදු කාර්යය පිරිවැය		
1504	විදුලිය හා ජල පිරිවැය 60%	14,300,944.38	11,694,289.91
1507	ආරක්ෂක සේවාවන් 50%	22,247,689.35	17,209,990.00
1403	යන්ත්‍රසූත්‍ර හා පිරියත සුළු අලුත්වැඩියා කටයුතු	3,988,884.26	2,335,692.21
2102B	යන්ත්‍රසූත්‍ර හා පිරියත නඩත්තු වියදම්	1,954,010.37	928,687.97
1708	ක්ෂය ගිණුම් - මිලදී ගැනීම්	96,538,598.90	79,681,591.27
		139,030,127.26	111,850,251.36
	අඩුකලා - 12.31 දිනට තොගය		
	මත්ස්‍ය බීජ	(3,823,435.00)	(12,003,600.00)
		(3,823,435.00)	(12,003,600.00)
	එකතුව	**257,896,977.68**	**223,527,832.16**

සටහන

1) NAQDA මත්ස්‍ය බීජ විකුණුම් මිල පදනම් කර ගෙන ගණනය කර ඇත. .

2) 2020 වර්ෂයේ සිට NAQDA ජීව තොග ගණනය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 හි 34 වගන්තිය අනුගමනය කර ඇත.

05 වෙනත් ආදායම්

6303	සංචාරක බංගලා ආදායම	388,500.00	521,400.00
6304	වෙනත් ආදායම්	5,952,221.02	19,730,285.23
6305	නිවාස කුලී	397,390.11	333,596.76
6306	ටෙන්ඩර් තැන්පතු	2,005,929.50	558,545.00
6309	ආපදා ණය පොලී	2,314,930.02	1,873,760.83
6310	පාපැදි ණය පොලී	16,686.80	19,486.67
6312	විසිතුරු මත්ස්‍ය පුහුණු වැඩසටහන් ආදායම	9,221,972.00	1,620,050.00
6313	ජලජීවී බලපත්‍ර ආදායම	9,168,127.90	7,462,270.00
6315	කලාවැව මධ්‍යස්ථානයේ ලැබෙන කුලී ආදායම	4,176,009.85	8,391,534.50
6316	දඩ	4,039,662.94	3,603,580.88
6317	මත්ස්‍ය ඇගිල්ලන් ප්‍රවාහන ආදායම	14,368,506.00	8,210,323.35
6318	රසායනාගාර පරීක්ෂණ ආදායම්	8,335,676.00	5,062,750.00
6319	ධීවර හැඳුනුම්පත් ආදායම්	11,560.00	81,030.00
6320	ක්ෂේත්‍ර පිරික්සුම් ආදායම්	35,400.00	632,000.00
6321	ආදායම්-රාජය හා පුද්ගලික ව්‍යවසාය	1,690,000.00	2,062,739.40
6322	පොත් ණය පොලී ආදායම්	5,586.00	24,668.00
6404	ADB මිනිහැවරී ණය වාරික	150,000.00	100,000.00
6323	බැංකු පොළිt (A/N- BOC-85886176)	984,191.69	424,765.19
	VAT අධි වෙන්කිරීම	344,848.56	-
6324	මත්ස්‍ය පෝෂණ පුහුණු වැඩසටහන්	52,500.00	-
එකතුව		**63,659,698.39**	**60,712,785.81**

සටහන - බැංකු පොලී ආදායම වන්නෙ නියමු ව්‍යාපෘතියක් ලෙස "දිවිනැගුම" ගිණුම් ශේෂ සඳහා විවෘත කරන ලද overnight call deposit මත ලද පොළි ආදායම වේ.

06 පරිපාලන වියදම්

06.1 සේවක පාරිශ්‍රමික

1101	වැටුප් හා වෙනත් දීමනා	278,586,661.92	275,582,032.49
1102	අතිකාල හා නිවාඩු දින දීමනා	40,142,132.64	29,979,587.75
1103	වෙනත් දීමනා	69,183,085.37	70,516,215.78
1104	සේවක අර්ථසාධක මුදල් දායකත්වය	52,846,962.90	51,477,097.93
1105	සේවක භාරකාර අරමුදල් දායකත්වය	10,243,260.63	10,185,068.48
1307	නිල ඇඳුම් සඳහා දීමනා	193,299.00	239,674.26
1516	සේවක සුභසාධක වියදම්	3,117,721.45	2,761,865.32
1701	පාරිතෝෂික වෙන්කිරීම	13,593,153.73	27,436,338.39
		467,906,277.64	468,177,880.40

06.2 සන්නිවේදන

1502	දුරකථන, ටෙලෙක්ස් පණිවිඩ හා ෆැක්ස් වියදම්	4,338,400.54	4,059,146.25
1503	තැපැල් හා විදුලි පණිවුඩ වියදම්	773,147.13	547,199.02
		5,111,547.67	4,606,345.27

06.3 අලුත්වැඩියා හා නඩත්තු වියදම

1402	කාර්යාල සහ ගොඩනැගිලි සහ සුළු අලුත්වැඩියා	5,366,728.16	4,146,059.82
1404	කාර්යාල උපකරණ සහ සූළු අලුත්වැඩියා සඳහා	2,903,303.11	1,840,943.65
1705	ස්ථාවර වත්කම් ක්ෂය	107,503,296.95	80,892,625.78
		115,773,328.22	86,879,629.25

06.4		**කාර්යාල පරිශ්‍රය නඩත්තු වියදම්**		
	1505	කාර්යාල බදු කුලී සඳහා	2,872,046.60	1,372,273.13
	1506	වරිපනම්	266,664.22	79,210.96
	1508	කාර්යාල පවිත්‍රතා වියදම්	5,378,385.95	4,841,768.97
	1504A	විදුලි ගාස්තු	7,155,498.66	6,898,668.35
	1504B	ජල ගාස්තු	977,569.03	2,038,482.83
			16,650,164.46	15,230,404.24
06.5		**වෙනත් වියදම්**		
	1515	විගණන ගාස්තු	879,000.00	920,160.00
	1507	ආරක්ෂක සේවා ගාස්තු	22,247,689.35	17,209,990.00
	1510	වෙළෙඳ දැන්වීම්	5,270,842.80	2,328,830.00
	1306	පුවත්පත් සහ සඟරා	183,190.00	51,420.00
	1501	ප්‍රවාහන වියදම්	1,974,371.15	1,973,253.58
	1301	ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	6,258,750.51	5,321,438.96
	1513	මුද්‍රණ වියදම්	94,083.40	19,463.50
	1201	ගමන් වියදම් (දේශීය)	22,118,322.07	18,223,401.52
	1511	සංග්‍රහ වියදම්	917,805.37	686,519.29
	1514	අධ්‍යක්ෂ මණ්ඩල දීමනා	569,500.00	532,200.00
	1405	රසායනාගාර උපකරණ	677,885.00	301,621.50
	1303	යාන්ත්‍රික සහ විද්‍යුත් භාණ්ඩ	554,131.00	715,250.98
	1512	වෙනත් ගිවිසුම්කර සේවා	12,490,667.33	13,832,139.69
	1520	කලාවැව මධ්‍යස්ථානයේ ලැබෙන කුලී ආදායම	2,758,716.90	3,926,025.00
	1522	නීති සහ ඒ හා සමාන වියදම්	1,838,542.00	1,853,656.00
	1519	විසිතුරු මත්ස්‍ය පුහුණු වැඩසටහන් ආදායම	3,712,429.90	670,496.75
	1524	කල්බදු කුලී (මෙහෙයුම්)	2,572,560.00	4,716,360.00
	1525	ශ්‍රම ගාස්තු (බාහිර)	29,312,031.50	22,634,013.00
	2201-B	තොරතුරු තාක්ෂණික සේවා	2,573,855.85	2,127,307.40
		VAT ඌණ වෙන් කිරීම්	-	102,340.55
	1526	මත්ස්‍ය පෝෂණ වැඩසටහන් වියදම්	89,520.00	-
			117,093,894.13	98,145,887.72
	එකතුව		**722,535,212.12**	**673,040,146.88**

07 බෙදාහැරීමේ වියදම්

1302	රථ වාහන ධාවන වියදම්	24,105,832.31	18,264,417.55
1302B	මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රවාහන වියදම්	10,175,255.00	5,489,645.00
1401	ප්‍රධාන රථ වාහන සහ සුළු අලුත්වැඩියා වියදම්	21,881,293.16	6,827,879.53
1513-B	ධීවර හැදුනුම්පත්	3,628.00	1,428.00
2103C	රථ වාහන නඩත්තු වියදම්	2,111,917.39	8,099,405.82
1523	රථ වාහන රක්ෂණ වියදම්	888,574.83	1,937,007.52
2106	ජලජීවී වගා සංවර්ධනය	3,425,587.32	25,414,330.63
2108	ප්‍රදර්ශන වියදම්	410,845.00	-
2107	නීති විරෝධී ධීවර කටයුතු වැටලීම්	439,624.00	1,736,877.35
2111	පරීක්ෂණ කට්ටල	11,846,714.60	12,462,182.32
2109	පුහුණු වැඩසටහන් දේශීය සහ විදේශීය	1,546,671.70	358,804.80
2205-B	රසායනාගාර උපකරණ වියදම්	-	227,927.50
1521	වාහන බලපත්‍ර සහ දුම් පරීක්ෂණ ගාස්තු	733,110.00	549,491.25
1706	රථ වාහන ක්ෂය	24,534,763.96	30,694,180.88
1702	අඩමාන ණය	-	914,203.00
	බොල් ණය කපා හැරීම්	246,000.00	-
එකතුව		**102,349,817.27**	**112,977,781.15**

08 මූල්‍ය වියදම්

1601	බැංකු ගාස්තු	208,883.60	97,525.63
එකතුව		**208,883.60**	**97,525.63**

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම් සටහන්

09 දේපල හා පිරියත උපකරණ

		ඉඩම්	ගොඩනැගිලි හා ඉදිකිරීම්	ලිඛිබූ හා කාර්යාලීය උපකරණ	රසායනාගාර උපකරණ	යාන්ත්‍රික හා වෙනත් උපකරණ	පරිභෝජන හා විවිධ වියදම්	උපකරණ හා උපාංග	රථ වාහන	පරිගණක හා සන්නිවේදන	පරිගණක මෘදුකාංග	එකතුව
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය/වෙළඳපොල වටිනාකම												
2020 වර්ෂයේ ආරම්භක ශේෂය		**141,411,854**	**1,750,776,496**	**74,094,231**	**25,975,332**	**43,616,638**	**10,137,649**	**1,573,467**	**235,467,775**	**26,260,822**	**3,737,463**	**2,313,051,727**
එකතු කිරීම්				3,930,717	-	20,037,545			1,739,260	1,980,060	1,095,120	**28,782,703**
එකතුකිරීම්(මුදල් නොවන දෑ)												-
ඉවත් කිරීම්			(11,800,000)									**(11,800,000)**
ප්‍රත්‍යාගණන ලාභ												-
වර්ෂය තුල හුවමරුකිරීම්			666,652,793									**666,652,793**
ගැලපුම්			370,477									**370,477**
ප්‍රාග්ධනිත නොකල වත්කම් (පෙර වර්ෂ ගැලපුම්)	10.1											-
2020 වර්ෂයේ අවසාන ශේෂය		**141,411,854**	**2,405,999,766**	**78,024,948**	**25,975,332**	**63,654,183**	**10,137,649**	**1,573,467**	**237,207,035**	**28,240,882**	**4,832,583**	**2,997,057,699**
												-
2021 වර්ෂයේ ආරම්භක ශේෂය		**141,411,854**	**2,405,999,766**	**78,024,948**	**25,975,332**	**63,654,183**	**10,137,649**	**1,573,467**	**237,207,035**	**28,240,882**	**4,832,583**	**2,997,057,700**
එකතු කිරීම්			186,044,319	**22,269,537**	**5,533,623**	**9,400,436**	-	-	**6,025,215**	**13,362,290**	**790,560**	**243,425,980**
එකතුකිරීම්(මුදල් නොවන දෑ)												-
ඉවත් කිරීම්												-
ප්‍රත්‍යාගණන ලාභ												-
හුවමාරුකිරීම්												-
ගැලපුම්												-
ප්‍රාග්ධනිත නොකල වත්කම් (පෙර වර්ෂ ගැලපුම්)												-
2021 වර්ෂයේ අවසාන ශේෂය		**141,411,854**	**2,592,044,085**	**100,294,485**	**31,508,955**	**73,054,618**	**10,137,649**	**1,573,467**	**243,232,250**	**41,603,172**	**5,623,143**	**3,240,483,679**

	2,240,987,109	**(2,387,005,737.73)**	**(100,294,485.26)**	**3,208,974,722.80**	**(73,054,618.38)**	**196,323,067.60**	**(1,573,467.40)**	**(243,232,250.21)**	**31,451,446.29**	**32,570,761**	**3,238,910,209.14**
සමුච්චිත ක්ෂය											
2020 වර්ෂයේ ආරම්භක ශේෂය	-	**358,849,307**	**42,627,948**	**13,552,572**	**25,494,213**	**10,028,917**	**1,573,467**	**148,848,688**	**16,630,161**	**1,465,413**	**619,070,686**
කාලපරිච්ඡේදය තුල අයකිරීම්		69,446,503	5,516,273	1,963,312	2,954,654	104,273	-	30,694,181	3,492,681	369,584	**114,541,461**
ක්ෂය ගැලපීම් (අඩු/වැඩි)											-
ප්‍රත්‍යාගණන ගැලපීම්											-
ඉවත් කිරීම්		(9,912,000)						-			**(9,912,000)**
2020 වර්ෂයේ අවසාන ශේෂය	-	**418,383,810**	**48,144,221**	**15,515,884**	**28,448,867**	**10,133,190**	**1,573,467**	**179,542,869**	**20,122,842**	**1,834,997**	**723,700,147**
											-
2021 වර්ෂයේ ආරම්භක ශේෂය	-	**418,383,810**	**48,144,221**	**15,515,884**	**28,448,867**	**10,133,190**	**1,573,467**	**179,542,869**	**20,122,842**	**1,834,997**	**723,700,147**
කාලපරිච්ඡේදය තුල අයකිරීම්		96,112,614	5,502,569	2,222,595	5,374,916	4,458		24,534,764	3,190,113	470,948	**137,412,977**
ක්ෂය ගැලපීම් (අඩු/වැඩි)											-
ප්‍රත්‍යාගණන ගැලපීම්											-
ඉවත් කිරීම්											-
2021 වර්ෂයේ අවසාන ශේෂය	-	**514,496,424**	**53,646,790**	**17,738,480**	**33,823,784**	**10,137,648**	**1,573,467**	**204,077,633**	**23,312,954**	**2,305,944**	**861,113,125**
2021.12.31 දිනට ශුද්ධ පොත් වටිනාකම	**141,411,854**	**2,077,547,660**	**46,647,695**	**13,770,475**	**39,230,835**	**2**	**0**	**39,154,617**	**18,290,218**	**3,317,199**	**2,379,370,555**
2020.12.31 දිනට ශුද්ධ පොත් වටිනාකම	**141,411,854**	**1,987,615,956**	**29,880,727**	**10,459,448**	**35,205,315**	**4,459**	**0**	**57,664,166**	**8,118,040**	**2,997,586**	**2,273,357,552**

සටහන

*PYA - පෙර වර්ෂයේ ගැලපුම්

** ඉඩම් නක්සේරු වටිනාකම් මත පෙන්වා ඇති අතර 1998 වර්ෂයේ අමාත්‍යාංශ මණින් පැවරූ වත්කම් හැර සෙසු වත්කම් පිරිවැය මත පෙන්වා ඇත.*

